JSS 2026 4(1): 180-208

Journal of Social Sciences (JSS) - NISD
Volume 04 – Issue 01
DOI: https://doi.org/10.4038/jssnisd.v4i1.65

11

# A STUDY ON THE IMPACT OF IMAGE-BASED (PHOTO AND VIDEO) SEXUAL ABUSE ON WOMEN IN SRI LANKAN TELEGRAM CHANNELS

# ශ්‍රී ලංකාවේ ටෙලිග්‍රෑම් නාලික ආශ්‍රිතව රූප පාදක (ඡායාරූප සහ වීඩියෝ) ලිංගික අපයෝජන හේතුවෙන් කාන්තාවන්ට සිදුවන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

**H. M. D. Malinda[*1] , K. P. Gamage and[2]**

[*1] Publishing Officer, National Library and Documentation Services Board, Sri Lanka
[2] Senior Lecturer, Sri Palee Campus, University of Colombo, Sri Lanka
[*1]Email : dmherath1991@gmail.com

## ABSTRACT

*Cyber Sexual and Gender Based Violence (CSGBV) and Image-based sexual abuse (IBSA), including the non-consensual sharing of intimate photos and videos of women, has become a serious digital gender-based problem in Sri Lanka. Therefore, this study examines the psychological, social and economic harm experienced by women due to image-based sexual abuse. This research was conducted using a Questionnaire developed based on Snowball Sampling and based on Survey data collected from 100 Women affected by Image-based sexual abuse in Sri Lanka. The findings of the research indicate that Image-based sexual abuse has caused significant psychological harm to women. It was found that 63% of the respondents had informed External parties about the incidents they had encountered, while 37% had not informed external parties. The main reasons for not informing external parties about Image-based sexual abuse were 'fear of social stigma', 'low trust in authorities' and 'fear of discussing the matter in public'. Also, among the abusers, the categories of 'former intimate partner' and 'not knowing the abuser' were predominant, while 'unknown parties' and 'online groups' also represented a significant percentage. Also, the most commonly reported content shared was 'social media photos' (21.1%), 'nude photos' (14.6%) and 'edited photos' (12.2%), indicating that this abuse is not limited to nude content but can involve any Digital image. IBSA is a complex pattern of abuse that involves both power relations in personal relationships and anonymity in the cyber environment. Accordingly, IBSA in Sri Lanka causes*

*multidimensional harm that goes beyond psychological trauma and also includes social marginalization and Economic vulnerability. Therefore, these findings highlight the urgent need for strengthened legal frameworks, digital platform accountability and stakeholder-centered intervention mechanisms.*

**Keywords:** Abuse, CSGBV, Cybercrime, IBSA, Nude photos, Telegram

*1 ***Corresponding Author:*** **H. M. D. Malinda** *Email:* dmherath1991@gmail.com

**සාරසංක්ෂේපය**

*'සයිබර් ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය' (Cyber Sexual and Gender Based Violence -CSGBV) සහ කාන්තාවන්ගේ සමීප ඡායාරූප සහ වීඩියෝ එකඟතාවයකින් තොරව බෙදා හැරීම ඇතුළුව රූප මත පදනම් වූ ලිංගික අපයෝජනය (Image-based sexual abuse-IBSA) ශ්‍රී ලංකාවේ ඩිජිටල් ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ බරපතල ගැටලුවක් වී ඇත. එබැවින් මෙම අධ්‍යයනයෙන් කාන්තාවන් රූප මත පදනම් වූ ලිංගික අපයෝජන හේතුවෙන් අත්විඳින මානසික, සමාජීය සහ ආර්ථික හානිය පරීක්ෂා කිරීම සිදු කරයි. ඒ අනුව හිමබෝල නියැදිය මත පදනම්ව සකස් කරන ලද ප්‍රශ්නාවලියක් උපයෝගී කර ගෙන ශ්‍රී ලංකාව තුළ රූප මත පදනම් වූ ලිංගික අපයෝජන බලපෑමට ලක් වූ කාන්තාවන් 100 දෙනකුගෙන් ලබා ගත් සමීක්ෂණ දත්ත මත පදනම්ව මෙම පර්යේෂණය සිදු කරනු ලැබීය. පර්යේෂණයේ සොයාගැනීම්වලින් පෙනී යන්නේ රූප මත පදනම් වූ ලිංගික අපයෝජනය කාන්තාවන්ට සැලකිය යුතු මානසික හානියක් සිදු කර ඇති බවයි. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 63%ක් තමන් මුහුණ දුන් සිදුවීම් බාහිර පාර්ශ්වයන්ට දැනුම් දී ඇති අතර 37%ක් එසේ නොකළ බව හඳුනාගත හැකි විය. දැනුම් නොදීම සඳහා බලපෑ ප්‍රධාන හේතු ලෙස 'සමාජ අපකීර්තියට ඇති බිය', 'බලධාරීන් කෙරෙහි ඇති විශ්වාසය අවම වීම' සහ 'ප්‍රසිද්ධියේ එම කරුණ සාකච්ඡා කිරීමට ඇති බිය' යන කරුණු ප්‍රමුඛ වී තිබේ. අපයෝජනය සිදු කළ පාර්ශ්වයන් අතර 'පෙර සමීප සහකරු' සහ 'අපයෝජනය සිදු කළ පාර්ශ්වයන් ගැන දැනුවත් නොවීම' යන කාණ්ඩ ප්‍රමුඛත්වය ගන්නා අතර 'නොදන්නා පාර්ශ්වයන්" සහ 'මාර්ගගත කණ්ඩායම්' ද සැලකිය යුතු ප්‍රතිශතයක් නියෝජනය කරයි. එසේම බෙදාහරින ලද අන්තර්ගත අතරින් 'සමාජ මාධ්‍යයේ පළ කළ ඡායාරූප' (21.1%), 'නිරුවත් ඡායාරූප' (14.6%) සහ 'සංස්කරණය කරන ලද ඡායාරූප' (12.2%) ප්‍රධාන වශයෙන් වාර්තා වීමෙන් මෙම අපයෝජනය නිරුවත් අන්තර්ගතයට පමණක් සීමා නොවී ඕනෑම ඩිජිටල් රූපයක් අපයෝජනයට ලක්විය හැකි බව පෙන්වයි. IBSA යනු පෞද්ගලික සම්බන්ධතා තුළ පවතින බල-සම්බන්ධතා හා සයිබර් පරිසරයේ අනන්‍යතා සඟවා තැබීම (anonymity) යන කරුණු දෙකම සම්බන්ධ කර ගත් සංකීර්ණ අපයෝජන රටාවක් බවට පෙන්නුම් කරයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ IBSA යනු මානසික කම්පනයෙන් ඔබ්බට යන බහුමාන හානියක්*

*ඇති කරන අතර ඒ තුළට සමාජ ආන්තිකකරණය සහ ආර්ථික අවදානම ද ඇතුළත් වේ. එබැවින් මෙම සොයාගැනීම් ශක්තිමත් කරන ලද නීතිමය රාමු, ඩිජිටල් වේදිකා වගවීම සහ මෙවැනි සිදුවීම්වලට මුහුණ දුන් පාර්ශ්වයන් කේන්ද්‍ර කරගත් මැදිහත්වීමේ යාන්ත්‍රණය සඳහා හදිසි අවශ්‍යතාවය ඉස්මතු කරයි.*

**මුඛ්‍ය පද:** *IBSA, CSGBV, අපයෝජනය, ටෙලිග්‍රෑම්, නිරුවත් ඡායාරූප, සයිබර් අපරාධ*

## 1.0 හැඳින්වීම

ඩිජිටල් තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුවත් සමඟ අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය මඟින් මිනිසාගේ දෛනික ජීවිතයේ විශාල වෙනසක් සිදු කර ඇත. නමුත් මෙම තාක්ෂණික ප්‍රගතිය සමඟ නවීකරණය වූ අපරාධ හා සමාජ ගැටලු රැසක් ද ඉස්මතු වී ඇත. ඒ අතරින් ප්‍රධානම ගැටලුවක් වන්නේ රූප පාදක (ඡායාරූප හා වීඩියෝ) ලිංගික අපයෝජනය යි (Image-Based Sexual Abuse–IBSA). එනම්, පුද්ගලයකුගේ අවසරයකින් තොරව ඔහුගේ හෝ ඇයගේ පෞද්ගලික (Personal), නිරාවරණ (Expose/ Nude) හෝ අර්ධ-නිරාවරණ (Semi-expose/ Semi-nude) ඡායාරූප (Photo) හෝ වීඩියෝ (Video) සමාජ මාධ්‍ය තුළ බෙදාහැරීම හෝ එසේ බෙදාහරින බවට තර්ජනය කිරීම යි.

“අන්තර්ජාලය, සමාජ මාධ්‍ය සහ මාර්ගගත විදුලි සංදේශ ක්‍රම භාවිතය ඉහළ යාමත් සමඟ ‘සයිබර් ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය’ (Cyber Sexual and Gender Based Violence -CSGBV) ගෝලීය ප්‍රපංචනාත්මක සංසිද්ධියක් බවට පත්ව ඇත. මාර්ගගත අවකාශයේ සිදු කරන බොහෝ වැරදි නොබැඳිව/ භෞතිකව (Offline/ Physical) සිදු කරන වැරදිවලට සමාන වේ. CSGBV හි අපරාධකරුවන්ට භෞතික ලෝකයට සාපේක්ෂ ව පහසුවෙන් අන්තර්ජාලය මඟින් වින්දිතයින්ට ප්‍රවේශ විය හැකිය. මන්ද ඔවුන් භූගෝලීයව (භෞතික) සීමා වී නොමැති බැවිනි (Palansuriya & Perera, 2023, p12). පවතින අධ්‍යයනවලින් හෙළි වන්නේ මෑත කාලයේ මෙම මාර්ගගත හිරිහැර වැඩි වී ඇති බව යි. සමහර අධ්‍යයනයන්ට අනුව ලොව පුරා සයිබර් හිරිහැර කිරීම් 6.5% සිට 72% දක්වා පරාසයක පවතී (Hinduja and Patchin, 2008). මෑත කාලීන සමීක්ෂණයකින් හෙළි වූයේ ඇමරිකානුවන් දස දෙනකුගෙන් හතර දෙනකු පමණ මාර්ගගත හිරිහැරවලට පෞද්ගලිකව මුහුණ දී ඇති බවත් 55%ක් එය ප්‍රධාන ගැටලුවක් ලෙස සලකන බවත්ය (Pew Research Center, 2021).

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය CSGBV නිර්වචනය කරන්නේ "කාන්තාවකට එරෙහිව, ඇය කාන්තාවක් වීම නිසා හෝ කාන්තාවන්ට අසමාන ලෙස බලපාන ජංගම දුරකථන/ ස්මාර්ට්ෆෝන්, අන්තර්ජාලය, සමාජ මාධ්‍ය වේදිකා හෝ විද්‍යුත් තැපැල වැනි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය මඟින් අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් කාන්තාවන්ට එරෙහිව සිදුකරන ලද ඕනෑම ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩ ක්‍රියාවකි" (Human Rights Council, 2018). එසේම International Centre for Research on Women (ICRW) විසින් ඉදිරිපත් කරන ලද නිර්වචනය අනුව "තාක්ෂණයෙන් පහසුකම් සපයන ලද ලිංගික හිංසනය (Technology-facilitated sexual violence) යනු එක් අයකු හෝ කිහිප දෙනකු විසින් ඔවුන්ගේ ලිංගික හෝ ස්ත්‍රීපුරුෂ අනන්‍යතාව මත පදනම් ව හෝ හානිකර ස්ත්‍රී පුරුෂ සම්මතයන් බලාත්මක කිරීමෙන් අන්අයට හානි කරන ක්‍රියාවකි. මෙම ක්‍රියාව අන්තර්ජාලය සහ/හෝ ජංගම දුරකථන තාක්ෂණය භාවිතයෙන් සිදු කරනු ලබන අතර එයට ලුහුබැඳීම (Stalking), හිරිහැර කිරීම (Harassment), ලිංගික හිරිහැර (Sexual harassment), අපහාසය, වෛරී ප්‍රකාශ සහ සූරාකෑම ඇතුළත් වේ" (Hinson et al, 2018).

"පුද්ගලයකුගේ ලිංගික හැසිරීම් (Sexual behaviors), දිශානතිය (Sexual orientation), ලිංගික ජීවිතය (Sexual life) යනාදිය කෙරෙහි අවධානය යොමු නොකරන හෝ ලිංගික කරදර ඇති කිරීමට අදහස් නොකළ හිරිහැර ආකාර අතථ්‍ය අවකාශයන්හි (Virtual spaces) බහුල ව දක්නට ලැබේ. ඒ යටතට පුද්ගලයන් මාර්ගගත සංසදවලින් (Online forums) හෝ සංවාද කණ්ඩායම්වලින් (Chat groups) බැහැර කිරීම, අපහසුතාවට පත් කරන නමුත් ලිංගික නොවන පුද්ගලික තොරතුරු/රූප/වීඩියෝ ප්‍රකාශයට පත් කිරීම, පුද්ගලයකුගේ පෙනුම, විශ්වාසයන්, ආගම ආදිය පිළිබඳ ව රළු හෝ නින්දා සහගත අදහස් දැක්වීම, සමාජ ජාල වෙබ් අඩවි සහ සංවාද කණ්ඩායම්වල (Chat groups) කටකතා පතුරුවා හැරීම, පුද්ගලයකුගේ භෞතික ආරක්ෂාවට, දේපළවලට හෝ කීර්ති නාමයට හානි කරන මාර්ගගත තර්ජන මේ යටතට අයත් වේ (Harasgama et al., 2025, p1).

මාර්ගගතව සිදුවන ලිංගික හිරිහැර වර්තමානය වන විට වර්ධනය වී තිබේ. එය රූප පාදක කර ගනිමින් ප්‍රබල ලෙස සිදුවන අයුරු දැකගත හැකිය. ජාත්‍යන්තර පර්යේෂණවලට අනුව රූප පාදක ලිංගික අපයෝජනය (IBSA) වර්ධනය වෙමින් පවතින ගෝලීය ගැටලුවක් වන අතර විශාල පිරිසක් මෙයට ගොදුරු වන බව පෙන්වයි. විශේෂයෙන් කාන්තාවන් සහ තරුණ පිරිස් මෙහි වැඩි බලපෑමට ලක් වන අතර මෙම අපයෝජනය මඟින් පුද්ගලයන්ගේ මානසික සෞඛ්‍යයට ද දැඩි හානි සිදු වේ. රූප

පාදක ලිංගික අපයෝජනය සමාජීය වශයෙන් ද ගැඹුරු බලපෑම් ඇති කරනු ලබයි. ගොදුරු වූ පුද්ගලයන් සමාජයෙන් වෙන්වීම, නින්දාවට ලක්වීම වැනි තත්ත්වයන්ට මුහුණ දෙති. මෙවැනි අපයෝජන නිසා රැකියා අහිමි වීම, අධ්‍යාපනික හා වෘත්තීය අවස්ථා අහිමි වීම වැනි ආර්ථික බලපෑම් ද ඇති කරන බව පර්යේෂණ පෙන්වයි.

සයිබර් ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (Cyber Sexual and Gender Based Violence -CSGBV) වර්තමානයේ ශ්‍රී ලංකාවේ ද බහුලව දක්නට ලැබෙන ගැටලුවක් වී ඇත. ශ්‍රී ලංකා පරිගණක හදිසි සූදානම කණ්ඩායම (Sri Lanka Computer Emergency Readiness Team-SLCERT) වාර්තා කරන ආකාරයට 2019 වසරේ දී මෙවැනි සිදුවීම් 3566ක් වාර්තා වන විට 2020 වසරේ දී සිදුවීම් 16,376ක් සහ 2021 වසරේ දී සිදුවීම් 18,214ක් වාර්තා වී ඇත (SLCERT, 2021). මෙම දත්ත අනුව මෙවැනි සිදුවීම් කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය සිදු වූ අවධියේ දී බහුල ලෙස වාර්තා වී තිබේ. "ගෝලීය පර්යේෂණවලින් පෙනී යන්නේ කොවිඩ් වසංගතය අතරතුර රැකියාවට, අධ්‍යාපනයට සහ ක්‍රියාකාරී පුරවැසිභාවයට ඇති බාධක ඉක්මවා යාම සඳහා කොවිඩ් 19 වෛරසයේ ව්‍යාප්තිය සමඟ සිදු වූ හුදෙකලාකරණය (Lockdown) අතරතුර මාර්ගගත වේදිකා (Online platform) භාවිතය ඉහළ ගිය බැවින් මාර්ගගත (Online) ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ද ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බවයි" (Biswas, 2023). මේ තත්ත්වය ආසියානු කලාපයේ බොහෝ රටවල ද මතුව ඇති ප්‍රබල ගැටලුවක් වී තිබේ. "කොවිඩ් 19 අගුලු දැමීමත් සමඟ ඉන්දියාවේ කේරළ ප්‍රාන්තයේ ළමා කාමුක දර්ශන නරඹන පුද්ගලයින්ගේ සංඛ්‍යාවේ තියුණු වැඩිවීමක් දක්නට ලැබුණි. මෑත කාලීන වාර්තාවල දැක්වෙන්නේ රට පුරා කාමුක දර්ශන නැරඹීම ඉහළ අනුපාතයක් ගැනීම සහ ළමා කාමුක දර්ශන සඳහා ඇති ඉල්ලුම ද වැඩි වී ඇති බව යි. 2012 වසරේ දී Times of India පුවත්පතේ වාර්තාවලට අනුව ඉන්දියාවේ සෙසු ප්‍රාන්ත හා සසඳන විට විශාලතම කාමුක වීඩියෝ නිෂ්පාදකයා වන්නේ කේරළය යි. ඒ වාර්තාව අනුව ත්‍රිවාන්ද්‍රම් සහ කොචි කේරළයේ ඉහළම කාමුක දර්ශන නරඹන්නන්ගේ ලැයිස්තුවේ කැපී පෙනේ. මත්පැන්වලට ඇබ්බැහි වීම, ලිංගික අධ්‍යාපනය නොමැතිකම සහ ගතානුගතික සමාජයක් මෙම තත්ත්වයට හේතුවන සාධක ලෙස සැලකේ (Vishnuprasad & Mathew, 2020, p1591).

ශ්‍රී ලංකාවේ ද සයිබර් ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය යන්න පුළුල් සමාජ ගැටලුවක් ලෙස පවතින අතර එය වර්ධනය වෙමින් පවතින ප්‍රවණතාවක් බව පර්යේෂණ මඟින් තහවුරු වී තිබේ. කොවිඩ් 19 වසංගතයේ ව්‍යාප්තියත්

ශ්‍රී ලංකාවේ ඇතිවූ ආර්ථික බංකොලොත්භාවයත් (Economic crisis) සමඟ හුදෙකලාකරණය කිරීමත්, මාර්ගගත ක්‍රමයට මිනිසුන් හුරුවීමත්, සමාජ මාධ්‍ය භාවිතය ඉහළ යාමත් සමඟ Telegram, WhatsApp, Instagram වැනි සමාජ මාධ්‍ය මඟින් මෙවැනි අසභ්‍ය අන්තර්ගත බෙදාහැරීම පහසු වී ඇති බව පර්යේෂණවලින් පෙන්වයි. බොහෝ සිද්ධීන් වාර්තා නොවීම, නීතිමය ප්‍රවේශයේ සීමා සහ සමාජයේ පවතින ගතානුගතික අදහස් හේතුවෙන් මෙවැනි සිදුවීම්වලට ගොදුරු වූ කාන්තාවන්ට යුක්තිය ලබා ගැනීම අපහසු වී තිබේ.

“2013 දී ආරම්භ වූ Telegram යනු මාසිකව මිලියන 800ක් පමණ ක්‍රියාකාරී පරිශීලකයින් සිටින ක්ෂණික පණිවිඩකරණ වේදිකාවකි. 2021 දී වසරේ දී මෙහි ක්‍රියාකාරී පරිශීලකයින් සංඛ්‍යාව ඉහළ ගොස් ඇති අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් WhatsApp හි රහස්‍යතා ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමෙන් පසු WhatsApp වෙතින් Telegram වෙත මාරු විය. Telegram පරිශීලකයින්ට කෙටි පණිවිඩ, රූප, වීඩියෝ, ශ්‍රව්‍ය, ස්ටිකර් ආදිය 2GB දක්වා බරැති ගොනු (File), සම්බන්ධතා සහ ඒවායේ තත්කාලීන ස්ථානය බෙදා ගත හැකිය. දුරකථන අංකය හෝ වෙනත් පුද්ගලික තොරතුරු අනාවරණය නොවන ආකාරයට පරිශීලකයින්ට ශ්‍රව්‍ය සහ දෘශ්‍ය ඇමතුම් ලබා ගත හැකිය (Franco et al., 2024, p28). ටෙලිග්‍රෑම් නාලිකා තුළ කණ්ඩායම් (Group), නාලිකා (Channel), බොට්ස් (Bots) එනම්, ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන ගිණුම් වැනි විවිධාකාර වූ ක්‍රමවේද රැසක් පවතී. ටෙලිග්‍රෑම් සංකේතනය කර ඇති අතර අනෙකුත් මාර්ගගත කතාබස් යෙදුම් (Online chat applications) හා සසඳන විට එයට ප්‍රවේශ වීම පහසු ය (Packeer & Kannangara, 2022, p73).

Telegram වැනි මධ්‍යස්ථ නොවන ක්ෂණික පණිවිඩකරණ වේදිකාවල නැගීම මඟින් පුද්ගලයන්ගේ සමීප රූප සහ වීඩියෝ කිසිදු එකඟතාවයකින් තොරව බෙදා හැරීම (Share) උග්‍ර කරන ලද ගැටලුකාරී සංසිද්ධියක් වේ. මෙම බෙදා හැරීම් අදියර 02ක් යටතේ සිදු වේ. එනම්,

01- සමීප සාමාජිකයින් විසින් ‘අනාවරණය කිරීම’ (Expose). මෙහි දී මිතුරන්, පෙම්වතියන්, හිටපු සහකරුවන්, භාර්යාවන්, පවුලේ සාමාජිකයන් හෝ සමීපතමයන් මේ යටතට අයත් වේ. මෙම අදියරේ දී සවිස්තරාත්මක පුද්ගලික තොරතුරු අනාවරණය කරන අතර එමඟින් වින්දිතයාගේ වයස, පදිංචි ස්ථානය හෝ සමාජ මාධ්‍ය පරිශීලක නාම ආදිය ද අනාවරණය වීම සිදු වේ.

02- සමීප නොවන ටෙලිග්‍රෑම් කණ්ඩායම් හි පරිශීලකයන් විසින් නැවත එම අන්තර්ගත බෙදා ගැනීම. 'අනාවරණය කිරීමේ' ක්‍රියාවලිය සම්පූර්ණ වන්නේ මෙම දෙවැනි අදියර තුළිනි. එහි දී Telegram කණ්ඩායම් තුළ සහ ඉන් ඔබ්බට අදාළ ද්‍රව්‍ය අසීමිත ලෙස නැවත බෙදා ගැනීම සිදු වේ (Sidoti et al., 2023).

මෙම පසුබිම තුළ ශ්‍රී ලංකාවේ ටෙලිග්‍රෑම් නාලිකා ආශ්‍රිත රූප පාදක ලිංගික අපයෝජනය පිළිබඳ විද්‍යාත්මක හා පද්ධතිමය අධ්‍යයන සීමිත වීම ද සැලකිල්ලට ගත යුතු කරුණකි. පවතින පර්යේෂණ බොහෝ විට සයිබර් අපයෝජනය හෝ මාර්ගගත හිංසනය (Online harassment) පිළිබඳ පුළුල් වශයෙන් කතා කරන නමුත් රූප පාදක ලිංගික අපයෝජනය පිළිබඳ විශේෂ අවධානය අඩුවෙන් දක්නට ලැබේ. "2023 ආරම්භය වන විට ශ්‍රී ලංකාවේ අන්තර්ජාල භාවිතා කරන්නන් මිලියන 14.58ක් සිටින අතර එය සමස්ත ජයගහණයෙන් 52%කි. එසේ ම ශ්‍රී ලංකාවේ ඩිජිටල් සාක්ෂරතාව 57.2%කි (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2023). "විදුලි සංදේශන හා නියාමන කොමිෂන් සභාවේ දත්ත අනුව 2025 මුල් භාගය වන විට ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන සම්බන්ධතා මිලියන 29.3ක් සක්‍රීයව පවතින අතර ජනගහනයෙන් 30% කට වඩා සමාජ මාධ්‍ය වේදිකාවල ක්‍රියාකාරීව පවතී" (DataReportal, 2025).

මේ ආකාර ඩිජිටල් සංස්කෘතියක් පවතින ශ්‍රී ලංකාවේ සයිබර් ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය තවදුරට ආගන්තුක දෙයක් නොවේ. ශ්‍රී ලංකාවේ සයිබර් ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය බහුල ව සිදුවන සමාජ මාධ්‍ය වේදිකාව ලෙස Facebook හඳුනාගෙන ඇත. ඒ හා සමාන අන්තර්ගතයන් WhatsApp, TikTok සහ YouTube හරහා ද සිදුවන බවට පර්යේෂණ මඟින් තහවුරු කර තිබේ (Samarakoon et al, 2021).

එබැවින් ශ්‍රී ලංකාව තුළ සයිබර් අවකාශය ඉලක්ක කර ගත් ලිංගික හිංසන සම්බන්ධයෙන් පර්යේෂණ කිහිපයක් හඳුනා ගත හැකිය. එම පර්යේෂණ අසභ්‍ය අන්තර්ගත සහිත වෙබ් අඩවි, Facebook වැනි සමාජ මාධ්‍ය පාදක කර ගෙන සිදු කළ පර්යේෂණ වන අතර Telegram නාලිකා තුළින් සිදුවන ලිංගික හිංසන සම්බන්ධයෙන් මෙතෙක් පර්යේෂණ සිදු කර නොමැත. එබැවින් මෙම පර්යේෂණ හිඩැස පුරවමින් Telegram නාලිකා තුළ කාන්තාවන්ගේ නිරුවත් ඡායාරූප සහ වීඩියෝ බෙදා හැරීම නිසා එම කාන්තාවන්ට සිදුවන බලපෑම සම්බන්ධයෙන් මෙම පර්යේෂණය සිදු කෙරේ.

**1.1 පර්යේෂණ ගැටලුව** (Research Problem)

ශ්‍රී ලංකාවේ ඩිජිටල් මාධ්‍ය භාවිතය වැඩි වීමත් සමඟ රූප පාදක (ඡායාරූප සහ වීඩියෝ) ලිංගික අපයෝජනය ගැඹුරු සමාජීය ප්‍රශ්නයක් බවට පත්ව ඇත. විශේෂයෙන් කාන්තාවන්ගේ පෞද්ගලික ඡායාරූප හෝ වීඩියෝ ඔවුන්ගේ අනුමැතියකින් තොරව බෙදාහැරීම, ප්‍රචාරය කිරීම හෝ භාවිත කිරීම මඟින් ඔවුන්ට මානසික ආතතිය, සමාජීය අපහාස සහ ආර්ථික අවස්ථා අහිමි වීම් වැනි බහුමානික හානි සිදු වේ. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද පර්යේෂණ අවම නිසා ශ්‍රී ලංකාවේ ටෙලිග්‍රෑම් නාලිකා ආශ්‍රිත ව රූප පාදක ලිංගික අපයෝජන හේතුවෙන් කාන්තාවන්ට සිදුවන බලපෑම කෙබඳුද? කියා මෙහි දී පරීක්ෂා කරනු ලැබේ.

**1.2 පර්යේෂණ අරමුණු** (Research Objectives)

ශ්‍රී ලංකාවේ ටෙලිග්‍රෑම් නාලිකා ආශ්‍රිතව රූප පාදක (ඡායාරූප සහ වීඩියෝ) ලිංගික අපයෝජන හේතුවෙන් කාන්තාවන්ට සිදුවන බලපෑම පිළිබඳ සිදු කරන මෙම අධ්‍යනයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට රූප පාදක ලිංගික අපයෝජනය හේතුවෙන් ඇතිවන මානසික, සමාජීය සහ ආර්ථික බලපෑම් විග්‍රහ කිරීම යි. ඒ තුළින් මෙම ක්ෂේත්‍රයේ පවතින පර්යේෂණ හිඩැස පිරවීමට සහ ප්‍රතිපත්තිමය හා නීතිමය මට්ටමින් වැඩි දියුණු කිරීම් සඳහා දායක වීමට අපේක්ෂා කරනු ලබයි.

**1.3 පර්යේෂණ උපන්‍යාසය** (Research Hypotheses)

ශ්‍රී ලංකාවේ ටෙලිග්‍රෑම් නාලිකා ආශ්‍රිතව රූප පාදක (ඡායාරූප සහ වීඩියෝ) ලිංගික අපයෝජන හේතුවෙන් කාන්තාවන්ගේ මානසික, සමාජීය සහ ආර්ථික තත්ත්වයට නිශේධනාත්මක බලපෑමක් ඇති කරයි.

**2.0 පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ශ්‍රී ලංකාවේ ටෙලිග්‍රෑම් නාලිකා ආශ්‍රිතව රූප පාදක (ඡායාරූප සහ වීඩියෝ) ලිංගික අපයෝජන හේතුවෙන් කාන්තාවන්ට සිදුවන බලපෑම් විමර්ශනය කිරීම අරමුණ කරගෙන සිදු කරන ලදී. එහි දී ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය (Quantitative Approach) උපයෝගී කර ගන්නා ලදී. ප්‍රමාණාත්මක

දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය යටතේ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් (Questionnaire) භාවිත කිරීම සිදු කරන ලදී.

**2.1 නියැදිය** (Sampling)

මෙම පර්යේෂණයේ ප්‍රධාන නියැදිය ලෙස ශ්‍රී ලංකාවේ ටෙලිග්‍රෑම් නාලිකා ආශ්‍රිතව රූප පාදක ලිංගික අපයෝජනට ලක්වූ කාන්තාවන් යොදා ගන්නා ලදී. මෙම පර්යේෂණය තුළ අධ්‍යයනයට ලක්වන කණ්ඩායම රූප පාදක ලිංගික අපයෝජනයට (Image-Based Sexual Abuse) ලක්වූ කාන්තාවන් වන අතර එවැනි පාර්ශ්වයන් සමාජයේ විවෘතව හඳුනා ගත හැකි ජනගහණයක් නොවේ. අදාළ සිදුවීම් පුද්ගලික, සංවේදී සහ සමාජ අපකීර්තියට හේතු විය හැකි බැවින්, වින්දිතයන් බොහෝ විට තම අනන්‍යතාව හෙළිදරව් කිරීමට මැලිකමක් දක්වති. එම නිසා මෙම ජනගහණය වෙත සෘජුව ප්‍රවේශ වීම අපහසු වේ. එබැවින් මෙවැනි සැඟවුණු (hidden population) සහ හඳුනා ගැනීමට අපහසු ජනගහණයන් අධ්‍යයනය කිරීම සඳහා හිමබෝල නියැදි ක්‍රමය (Snowball Sampling) වඩාත් යෝග්‍ය නියැදි තේරීමේ ක්‍රමවේදයක් ලෙස සමාජ විද්‍යාත්මක පර්යේෂණවල දී භාවිත කරනු ලැබේ. මෙම ක්‍රමය යටතේ මුලින්ම පර්යේෂණයට අදාළ ලක්ෂණ සහිත පුද්ගලයන් කිහිප දෙනෙකු හෝ ඔවුන් සම්බන්ධයෙන් පෞද්ගලිකව දන්නා පාර්ශ්වයන් හඳුනා ගෙන ඔවුන්ගේ නිර්දේශ මත එම අත්දැකීම් සහිත අනෙකුත් පාර්ශ්වයන් සම්බන්ධ කර ගැනීම සිදු කෙරේ. එමඟින් සාම්ප්‍රදායික නියැදි තේරීමේ ක්‍රම භාවිතයෙන් ළඟා වීමට අපහසු වූ සහභාගිවන්නන් වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලැබේ. මෙම පර්යේෂණයේදී ද රූප පාදක ලිංගික අපයෝජනයට ලක්වූ කාන්තාවන්ගේ පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව ප්‍රමුඛ ලෙස සැලකිල්ලට ගනිමින් ඔවුන්ට උපදේශන සේවා සපයන වෘත්තිකයන්ගේ මැදිහත්වීම සහ නිර්දේශ මත සහභාගිවන්නන් (වින්දිතයන් වූ කාන්තාවන්) 100 දෙනකු හඳුනා ගැනීම සිදු කරන ලදී. එම නිසා පර්යේෂණයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමටත්, විශ්වාසනීය දත්ත රැස් කිරීමටත්, සහභාගිවන්නන්ගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීමටත් හිමබෝල නියැදි ක්‍රමය වඩාත් සුදුසු ක්‍රමවේදයක් ලෙස තෝරා ගන්නා ලදී.

**2.2 දත්ත එකතු කිරීමේ හා විශ්ලේෂණය කිරීමේ ක්‍රම** (Data Collection and Analyz Methods)

ප්‍රශ්නාවලිය සකස් කිරීමේ දී පෞද්ගලික කරුණු කෙරෙහි අවධානය යොමු නොකර මානසික බලපෑම්, සමාජීය බලපෑම් සහ ආර්ථික බලපෑම් කෙරෙහි අවධානය යොමු කරන ලදී. රැස් කර ගත් දත්ත SPSS මෘදුකාංගය උපයෝගී කර ගෙන විශ්ලේෂණය

කරන ලදී. දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රධාන වශයෙන් විස්තරාත්මක සංඛ්‍යාත්මක ක්‍රම (Descriptive Statistics) සහ අනුමාන සංඛ්‍යාත්මක ක්‍රම (Inferential Statistics) භාවිත කරන ලදී. විස්තරාත්මක සංඛ්‍යාත්මක ක්‍රම යටතේ ප්‍රතිචාරකයන්ගේ ජන විකාශන ලක්ෂණ, රූප පාදක ලිංගික අපයෝජනයේ ස්වභාවය සහ එහි බලපෑම් සම්බන්ධ දත්ත සංඛ්‍යාත (Frequencies), ප්‍රතිශත (Percentages), වගු (Tables) සහ ප්‍රස්තාර (Charts) මඟින් ඉදිරිපත් කරන ලදී. එසේම පර්යේෂණ උපන්‍යාසය පරීක්ෂා කිරීම සඳහා බහු රේඛීය ප්‍රතිගාමී විශ්ලේෂණය (Multiple Linear Regression Analysis) භාවිත කරන ලදී. මෙම විශ්ලේෂණය මඟින් රූප පාදක ලිංගික අපයෝජනය හේතුවෙන් කාන්තාවන්ට ඇතිවන මානසික, සමාජීය හා ආර්ථික බලපෑම් සහ ඔවුන්ගේ සමාජීය ක්‍රියාකාරීත්වය අතර පවතින සම්බන්ධතාව විමර්ශනය කරන ලදී. ප්‍රතිගාමී ආකෘතියේ සංඛ්‍යාත්මක වැදගත්කම පරීක්ෂා කිරීම සඳහා ANOVA (Analysis of Variance) පරීක්ෂණය භාවිත කළ අතර ස්වාධීන විචල්‍යයන්ගේ බලපෑමේ ප්‍රමාණය හඳුනා ගැනීම සඳහා Regression Coefficients Analysis සිදු කරන ලදී. එමෙන්ම විචල්‍යයන් අතර බහුසහසම්බන්ධතාව (Multicollinearity) පරීක්ෂා කිරීම සඳහා Tolerance සහ Variance Inflation Factor (VIF) අගයන් ද විමර්ශනය කරන ලදී.

### 2.3 සදාචාරාත්මක සලකා බැලීම් (Ethical Considerations)

මෙම අධ්‍යයනය සඳහා සංවේදී හා පුද්ගලික තොරතුරු සම්බන්ධ කරුණු ඇතුළත් වන බැවින් පර්යේෂණ සඳහා උපයුක්ත කර ගන්නා ආචාරධර්මීය මාර්ගෝපදේශයන් දැඩිව පිළිපැදීම අතවශ්‍ය විය. ඒ අනුව පර්යේෂණයට සහභාගී වූ කාන්තාවන්ගේ අනන්‍යතාව සම්පූර්ණයෙන්ම රහසිගතව තබා ගැනීම කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමු කරන ලදී. එහි දී සියලුම දත්ත රහසිගත ආකාරයෙන් ගොනු කර අනන්‍යතාව හඳුනාගත නොහැකි ලෙස දත්ත ලබා ගැනීම සහ වාර්තා කිරීම සිදු විය. පර්යේෂණයට අදාළ වින්දිතයන් සහභාගී කරවා ගැනීමට පෙර ඔවුන්ගේ 'දැනුවත් එකඟතාව/ කැමැත්ත' ලබා ගැනීමත් මෙම පර්යේෂණයේ අරමුණු සහ අභිමාර්ථ සම්බන්ධයෙන් දැනුවත් කිරීමත් සිදු විය. එමෙන්ම තමන්ට අවශ්‍ය විටක පර්යේෂණයෙන් ඉවත් වීමට ඇති අයිතිය පිළිබඳ පැහැදිලිව දැනුම් දෙන ලදී. මෙහි දී රැස්කර ගත් තොරතුරු පර්යේෂණ අරමුණක් වෙනුවෙන් පමණක් භාවිත කළ අතර කිසිදු අවස්ථාවක තෙවැනි පාර්ශ්වයකට ලබා දීමෙන් වැළකී සිටියේය.

## 3. දත්ත විශ්ලේෂණය

මෙම අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය කොටස තුළ ශ්‍රී ලංකාවේ ටෙලිග්‍රෑම් නාලිකා ආශ්‍රිතව රූප පාදක (ඡායාරූප සහ වීඩියෝ) ලිංගික හිංසනයට ලක් වූ කාන්තාවන්ගේ මානසික, සමාජීය සහ ආර්ථික තත්ත්වය සංඛ්‍යාත්මක දත්ත මඟින් විශ්ලේෂණය කිරීම සිදු කරනු ලබයි. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යාත්මක ක්‍රම (Descriptive statistics) යටතේ වගු, ප්‍රතිශත භාවිත කරමින් ප්‍රතිචාරකයන්ගේ ජන විකාශ සාධක හා ප්‍රධාන පරීක්ෂණ විචල්‍යයන් විශ්ලේෂණය කිරීම සිදු කරයි. එසේම, වයස, දිස්ත්‍රික්කය වැනි පරාමිති මත පදනම්ව විචල්‍යයන් අතර සම්බන්ධතා හඳුනාගැනීම ද සිදු වේ.

### 3.1 ජන විකාශ සාධක සම්බන්ධ දත්ත විශ්ලේෂණය

පර්යේෂණයේ දී ප්‍රථමයෙන් නියැදියට අයත් සාමාජිකයන්ගේ ජන විකාශ සාධක සම්බන්ධයෙන් අධ්‍යයනය කරනු ලැබීය. ඒ තුළින් මෙසේ වින්දිතයන් වූ කාන්තාවන්ගේ වයස්, අධ්‍යාපන මට්ටම් මෙන් ම රැකියාවේ ස්වභාවය සම්බන්ධයෙන් ද ජීවත් වන දිස්ත්‍රික්කය සහ ප්‍රදේශය සම්බන්ධයෙන් ද අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. ඒ තුළින් මෙවැනි සිදුවීම්හි ව්‍යාප්තිය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගත හැකිය.

#### 3.1.1 නියැදියට අයත් කාන්තාවන්ගේ වයස් කාණ්ඩය අනුව දත්ත විශ්ලේෂණය

3.1.1 වගුව : නියැදියට අයත් කාන්තාවන්ගේ වයස් කාණ්ඩය අනුව ව්‍යාප්තිය

| Generation | වයස් කාණ්ඩය | ප්‍රමාණය | ප්‍රතිශතය % |
|---|---|---|---|
| Gen Z | 18–24 | 25 | 25.0 |
| Gen Z + Gen Y | 25–34 | 47 | 47.0 |
| Gen Y | 35–44 | 22 | 22.0 |
| Gen X | 45+ | 6 | 6.0 |
| සමස්ත එකතුව | | 100 | 100.0 |

මූලාශ්‍ර - සමීක්ෂණ දත්ත 2026

නියැදියට අයත් කාන්තාවන්ගේ වයස් කාණ්ඩය අනුව සිදු කරන ලද දත්ත විශ්ලේෂණයේ දී ප්‍රධාන වශයෙන් නියැදියට ඇතුළත් කර ගත් වයස් කාණ්ඩයන් කොටස් කිහිපයක් යටතේ බෙදා වෙන් කර ගන්නා ලදී. එනම්, Gen Z (1997-2012 උපන්, වර්තමානයේ අවුරුදු 18-28), Gen Y (1981-1996, වර්තමානයේ අවුරුදු 29-44) සහ Gen X (1965-1980 උපන්, වර්තමානයේ අවුරුදු 45-60) ලෙස ය. ඒ අනුව මෙම

පර්යේෂණයට සහභාගී වූ රූප පාදක ලිංගික හිංසනයට ලක්වූ කාන්තාවන් 100 දෙනාගේ වයස් දත්ත පරම්පරා (Generations) අනුව විශ්ලේෂණය කළ විට බහුතරය නවීන ඩිජිටල් පරම්පරා 02 වන Gen Z සහ Y (72%) කාණ්ඩයට අයත් බව පැහැදිලි වේ. එසේ ම වයස අවුරුදු 18–24 වයස් කාණ්ඩය සම්පූර්ණයෙන් ම Gen Z (25%) පරම්පරාව නියෝජනය කරන අතර වයස අවුරුදු 25–34 වයස් කාණ්ඩය Gen Z සහ Y (47%) දෙකට ම අයත් වේ. එමෙන් ම වයස අවුරුදු 35–44 වයස් කාණ්ඩය Y (22%) ලෙස වර්ගීකරණය වන අතර 45 සහ ඊට වැඩි වයස් කාණ්ඩය Gen X ලෙස සීමිත ප්‍රමාණයක් (6%) පමණක් නියෝජනය කරයි. ඒ අනුව සමස්තයෙන් සැලකූ විට මෙම පීඩාවට ලක්වූවන්ගෙන් බහුතරය Gen Z සහ Y පරම්පරාවට අයත් වන අතර එය මෙම පරම්පරා දෙක ම සමාජ මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන වේදිකාවල වැඩි සක්‍රියභාවයක් ඇතිවීමත් සමඟ සම්බන්ධ විය හැකි බව පෙන්වයි. තවද Gen X පරම්පරාවේ නියෝජනය අඩු වීම ඔවුන්ගේ ඩිජිටල් භාවිතයේ අඩු මට්ටම හෝ මෙවැනි සිදුවීම් වාර්තා නොවීම වැනි හේතු නිසා විය හැකි ය.

### 3.1.2 දිස්ත්‍රික්කය අනුව දත්ත විශ්ලේෂණය

3.1.2 වගුව : නියැදියට අයත් කාන්තාවන්ගේ දිස්ත්‍රික්කය අනුව ව්‍යාප්තිය

| **දිස්ත්‍රික්කය** | ප්‍රමාණය | ප්‍රතිශතය % |
|---|---|---|
| ගාල්ල | 7 | 7.0 |
| මාතර | 8 | 8.0 |
| හම්බන්තොට | 4 | 4.0 |
| කළුතර | 7 | 7.0 |
| කොළඹ | 28 | 28.0 |
| කෑගල්ල | 3 | 3.0 |
| රත්නපුර | 4 | 4.0 |
| බණ්ඩාරවෙළ | 1 | 1.0 |
| කුරුණෑගල | 9 | 9.0 |
| මහනුවර | 11 | 11.0 |
| අම්පාර | 2 | 2.0 |
| ගම්පහ | 16 | 16.0 |
| **සමස්ත එකතුව** | **100** | **100.0** |

මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2026

රූප පාදක ලිංගික හිංසනයට ලක්වූ නියැදියට අයත් කාන්තාවන් 100 දෙනා ජීවත් වන දිස්ත්‍රික්කය අනුව සිදු කරන ලද දත්ත විශ්ලේෂණයේ දී මෙකී ගැටලුව බහුල ව ජනාකීර්ණ දිස්ත්‍රික්කවල දක්නට ලැබෙන බව අනාවරණය විය. දත්ත විශ්ලේෂණයේ දී

මෙවැනි සිදුවීම්වලට ලක්වූ කාන්තාවන් වැඩි වශයෙන් ජීවත් වන්නේ කොළඹ දිස්ත්‍රික්කය (28%) තුළ බව අනාවරණය විය. එය සෙසු සියලු දිස්ත්‍රික්කයන්ට වඩා සැලකිය යුතු ලෙස ඉහළ අගයකි. එයට අමතර ව ගම්පහ (16%), මහනුවර (11%) සහ කුරුණෑගල (9%) යන දිස්ත්‍රික්කයන් තුළින් ද මෙවැනි සිදුවීම් බහුල ව වාර්තා වන බව අනාවරණය විය. ඊට අමතර ව මාතර (8%), ගාල්ල (7%) සහ කළුතර (7%) වැනි දිස්ත්‍රික්කයන් මධ්‍යම මට්ටමේ නියෝජනයක් ඇති අතර හම්බන්තොට (4%), රත්නපුර (4%), කෑගල්ල (3%) සහ අම්පාර (2%) වැනි දිස්ත්‍රික්කයන් අඩු ප්‍රමාණයක් නියෝජනයක් පෙන්නුම් කරයි. මේ තුළින් පෙනී යන්නේ ප්‍රධාන නගර ආශ්‍රිත ව මෙවැනි සිදුවීම් වාර්තා වීම වැඩි බව යි. එනම් නාගරීකරණය සහ ඩිජිටල්කරණය වැඩි ප්‍රදේශවල මේ ගැටලුව බහුල ලෙස ඇති බව දක්නට ලැබේ.

### 3.1.3 පදිංචියේ ස්වාභාවය අනුව නියැදියේ දත්ත විශ්ලේෂණය

නියැදියට අයත් රූප පාදක ලිංගික හිංසනයට ලක්වූ කාන්තාවන් 100 දෙනාගේ පදිංචියේ ස්වභාවය අනුව සිදු කරන ලද දත්ත විශ්ලේෂණයේ ප්‍රතිඵල පහත 3.1.3 වගුවේ දැක්වේ.

3.1.3 වගුව : නියැදියට අයත් කාන්තාවන්ගේ පදිංචි ප්‍රදේශයේ ස්වාභාවය අනුව ව්‍යාප්තිය

| පදිංචියේ ස්වාභාවය | ප්‍රමාණය | ප්‍රතිශතය % |
|---|---|---|
| ග්‍රාමීය | 15 | 15.0 |
| නාගරික | 35 | 35.0 |
| අර්ධ නාගරික | 50 | 50.0 |
| සමස්ත එකතුව | 100 | 100.0 |

මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2026

ඉහත දත්ත විශ්ලේෂණය අනුව මෙම රූප පාදක ලිංගික හිංසනය සිදුවීම්වල ව්‍යාප්තිය ග්‍රාමීය (15%) කලාපවල අවම වශයෙන් සිදු වුවත් නාගරික (35%) සහ අර්ධ නාගරික (50%) ප්‍රදේශවල බහුල ව සිදුව ඇති බව අනාවරණය විය. ඒ අතරින් අර්ධ නාගරික ප්‍රදේශවල බහුලවම සිදුව ඇති බැව් මෙහි දී නිරීක්ෂණය වේ.

**3.1.4 නියැදියට අයත් කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම අනුව දත්ත විශ්ලේෂණය**

3.1.4 වගුව : නියැදියට අයත් කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම අනුව ව්‍යාප්තිය

| අධ්‍යාපන මට්ටම | ප්‍රමාණය | ප්‍රතිශතය % |
|---|---|---|
| අ.පො.ස. සාමාන්‍ය පෙළ | 3 | 3.0 |
| අ.පො.ස. උසස් පෙළ | 12 | 12.0 |
| ඩිප්ලෝමා | 5 | 5.0 |
| උපාධි අපේක්ෂක | 44 | 44.0 |
| උපාධිධාරී | 18 | 18.0 |
| පශ්චාත් උපාධිධාරී | 18 | 18.0 |
| **සමස්ත එකතුව** | **100** | **100.0** |

මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2026

නියැදියට අයත් කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම සම්බන්ධයෙන් සිදු කරන ලද දත්ත විශ්ලේෂණය අනුව මෙම ගැටලුවට මුහුණ දී ඇති කාන්තාවන් බහුතරයක් උසස් අධ්‍යාපනය ලබා ඇති බව නිරීක්ෂණය වේ. විශේෂයෙන් උපාධි අපේක්ෂක මට්ටමේ කාන්තාවන් 44 (44%) දෙනකු නියැදියට අයත් වන අතර එය නියැදියේ වැඩිම ප්‍රතිශයක් නියෝජනය කිරීමකි. ඊට අමතර ව උපාධිධාරීන් 18 දෙනකු පශ්චාත් උපාධිධාරීන් 18 දෙනකු ද නියැදිය නියෝජනය කරන අතර සමස්ත නියැදියෙන් 80%කට වැඩි ප්‍රතිශතයක් උසස් අධ්‍යාපනය ලබා තිබේ. මෙම ප්‍රතිඵල අනුව ටෙලිග්‍රෑම් නාලිකාවන් හි රූප පාදක ලිංගික හිංසනය උසස් අධ්‍යාපන ලැබූ සහ ඩිජිටල් පරිසරයන් තුළ වැඩි සක්‍රීයභාවයක් ඇති කාන්තාවන් අතර වැඩි වශයෙන් වාර්තා වන බව පෙන්නුම් කරයි. එමෙන් ම අඩු අධ්‍යාපන මට්ටම්වල නියෝජනය අඩු වීම මෙවැනි සිදුවීම්වල අඩුවීමක් ලෙස නොව වාර්තා නොකිරීම හෝ වාර්තා කිරීමට දැනුවත්භාවයක් නොමැති වීම නිසා සැඟවී පවතිනු ඇති බවට නිගමනය කළ හැකිය.

**3.1.5 නියැදියට අයත් කාන්තාවන්ගේ රැකියාව අනුව දත්ත විශ්ලේෂණය**

3.1.5 වගුව : නියැදියට අයත් කාන්තාවන්ගේ රැකියා තත්ත්වය අනුව ව්‍යාප්තිය

| රැකියාව | ප්‍රමාණය | ප්‍රතිශතය % |
|---|---|---|
| ශිෂ්‍ය | 27 | 27.0 |
| රාජ්‍ය අංශය | 38 | 38.0 |
| පෞද්ගලි අංශය | 21 | 21.0 |
| ස්වයං රැකියා | 7 | 7.0 |
| රැකියාවක් නොකරයි | 7 | 7.0 |
| සමස්ත එකතුව | 100 | 100.0 |

මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2026

නියැදියට අයත් කාන්තාවන්ගේ රැකියාව සම්බන්ධයෙන් සිදු කරන ලද දත්ත විශ්ලේෂණය අනුව මෙම ගැටලුව විවිධ වෘත්තීය පසුබිම් වෙත පැතිර ඇති අයුරු දැක ගත හැකිය. ඒ අනුව ටෙලිග්‍රෑම් නාලිකා ආශ්‍රිතව රූප පාදක ලිංගික හිංසනයට ලක් වූ නියැදියට අයත් කාන්තාවන් බහුතරයක් රාජ්‍ය අංශයේ (38%) සේවය කරන අතර ඊට අමතරව ශිෂ්‍යාවන් (27%) ද පෞද්ගලික අංශයේ සේවය කරනා 21%ක ද මෙවැනි හිංසනයන්ට ලක්ව ඇති බව ඉහත දත්ත විශ්ලේෂණය තුළින් පෙන්නුම් කරයි. 3.1.4 වගුවේ සඳහන් දත්ත විශ්ලේෂණය අනුව උපාධි අපේක්ෂකයන් (44%) ප්‍රමුඛ වන විට මෙම විශ්ලේෂණය තුළ රාජ්‍ය අංශය ප්‍රමුඛ වී ඇත. 3.1.4 වගුවේ උපාධි අපේක්ෂකයන් 3.1.5 වගුවේ ශිෂ්‍ය , පෞද්ගලික අංශය සහ රැකියාවක් නොකරන කාණ්ඩයන් ද නියෝජනය කරනු ලබයි. එබැවින් ඉහත දත්ත විශ්ලේෂණය අනුව පෙනී යන්නේ සමාජයේ නිරන්තරයෙන් ගැවසෙන කාන්තාවන් මෙවැනි හිංසනයන්ට ලක්වීමේ අවධානමක් ඇති බව යි. ඒ අනුව රූප පාදක ලිංගික හිංසනය ශ්‍රී ලංකාවේ විවිධ වෘත්තීය කාණ්ඩයන් තුළ පැතිරී ඇති සමාජය පුරා බලපාන ගැටලුවක් බව මේ දත්ත විශ්ලේෂණය තුළින් පෙනී යයි.

## 3.2 නියැදියේ ප්‍රතිගාමී දත්ත විශ්ලේෂණය (Regression analysis)

### 3.2.1 ANOVA විශ්ලේෂණය

3.2.1 වගුව : රූප පාදක ලිංගික අපයෝජනයේ බලපෑම් සම්බන්ධ ANOVA විශ්ලේෂණ ප්‍රතිඵල

| **ANOVA[a]** | | | | | | |
|---|---|---|---|---|---|---|
| Model | | Sum of Squares | Df | Mean Square | F | Sig. |
| 1 | Regression | 123.082 | 3 | 41.027 | 96.163 | .000[b] |
| | Residual | 40.958 | 96 | .427 | | |
| | Total | 164.040 | 99 | | | |

a. Dependent Variable: පෞද්ගලික, නිරුවත් හෝ අඩ නිරුවත් ඡායාරූප/වීඩියෝ බෙදා හැරීම නිසා සමාජයට මුහුණ දීමට නොහැකි වීම.

b. Predictors: (Constant), අන්තර්ජාලයේ හෝ සමාජ මාධ්‍යවල ඡායාරූප බෙදා ගැනීමට බියක් දැනීම/ සබඳතාවලට අහිතකර ලෙස බලපෑම/ රැකියාවට හෝ අධ්‍යාපනයට අහිතකර ලෙස බලපෑම.

මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2026

මෙම ANOVA විශ්ලේෂණ ප්‍රතිඵල අනුව 'පෞද්ගලික/නිරාවරණ ඡායාරූප හෝ වීඩියෝ බෙදාහැරීම හේතුවෙන් සමාජයට මුහුණ දීමට නොහැකි වීම' යන ආශ්‍රිත විචල්‍ය (Variable) සඳහා යොදාගත් ප්‍රතිගාමී (Regression) විශ්ලේෂණය සංඛ්‍යාත්මකව ඉතා වැදගත් බව පැහැදිලි වේ. Regression Sum of Squares (123.082) හා Residual Sum of Squares (40.958) අතර පවතින වෙනස මඟින් සමස්ත විචල්‍යයෙන් සැලකිය යුතු කොටසක් මෙමඟින් විස්තර කර තිබේ. තවද F අගය 96.163ක් ලෙස ඉතා ඉහළ අගයක් වීමත් එයට අදාළ Significance අගය 0.000ක් ($p<0.05$) වීමත් මෙම ප්‍රතිගාමී (Regression) විශ්ලේෂණය සම්පූර්ණයෙන්ම සංඛ්‍යාත්මකව වැදගත් බව තහවුරු කරයි.

ඒ අනුව අන්තර්ජාලයේ හෝ සමාජ මාධ්‍යයේ ඡායාරූප බෙදාගැනීමට ඇති භීතිය, සම්බන්ධතාවලට සිදු වූ අහිතකර බලපෑම් සහ රැකියාවට හෝ අධ්‍යාපනයට අහිතකර ලෙස බලපෑම යන සාධක එකතුවක් ලෙස සලකා බැලූ විට ඉතා ශක්තිමත් හා වැදගත් බලපෑමක් ඇති කර තිබේ. එබැවින් මෙම ප්‍රතිඵල මඟින් රූප පාදක ලිංගික අපයෝජනය හේතුවෙන් ඇතිවන මානසික හා සමාජීය ප්‍රතිවිපාක පුද්ගලයන්ගේ සමාජීය හැසිරීම් සහ සමාජය තුළ ක්‍රියාකාරීත්වය සෘජුවම බලපාන බව තහවුරු වේ.

### 3.2.1 Coefficients (සංගුණක) විශ්ලේෂණය

3.2.2 වගුව : ප්‍රතිගාමී විශ්ලේෂණයේ Coefficients (සංගුණක) ප්‍රතිඵල

**Coefficients[a]**

| Model | Unstandardized Coefficients | | Standardized Coefficients | t | Sig. | Collinearity Statistics | |
|---|---|---|---|---|---|---|---|
| | B | Std. Error | Beta | | | Tolerance | VIF |
| 1 (Constant) | -.738 | .295 | | -2.498 | .014 | | |
| අන්තර්ජාලයේ හෝ සමාජ මාධ්‍යවල ඡායාරූප බෙදා ගැනීමට බියක් දැනීම | .525 | .069 | .475 | 7.560 | .000 | .658 | 1.520 |
| සබඳතාවලට අහිතකර ලෙස බලපෑම | .260 | .057 | .265 | 4.591 | .000 | .779 | 1.284 |
| රැකියාවට හෝ අධ්‍යාපනයට අහිතකර ලෙස බලපෑම | .386 | .079 | .329 | 4.904 | .000 | .577 | 1.733 |

a. Dependent Variable: පෞද්ගලික, නිරුවත් හෝ අඩ නිරුවත් ඡායාරූප/වීඩියෝ බෙදා හැරීම නිසා සමාජයට මුහුණ දීමට නොහැකි වීම.

මෙම Coefficients වගුව මගින් 'පෞද්ගලික, නිරුවත් හෝ අඩ නිරුවත් ඡායාරූප/වීඩියෝ බෙදා හැරීම නිසා සමාජයට මුහුණ දීමට නොහැකි වීම' යන ආශ්‍රිත විචල්‍ය මත තෝරා ගත් ස්වාධීන විචල්‍යයන් 03ක බලපෑම විශ්ලේෂණය කර තිබේ. දත්ත විශ්ලේෂණයේ ප්‍රතිඵල අනුව ස්ථිර අගය (Constant) -0.738ක් ලෙස ලැබී ඇති අතර ($p=0.014<0.05$) එය සංඛ්‍යාත්මකව වැදගත් බව පෙන්වයි. විශේෂයෙන් 'අන්තර්ජාලයේ හෝ සමාජ මාධ්‍යවල ඡායාරූප බෙදා ගැනීමට බියක් දැනීම' ($B = 0.525$, $\beta = 0.475$, $p = 0.000$), 'සබඳතාවලට අහිතකර ලෙස බලපෑම' ($B = 0.260$, $\beta = 0.265$, $p = 0.000$) සහ 'රැකියාවට හෝ අධ්‍යාපනයට අහිතකර ලෙස බලපෑම' ($B = 0.386$, $\beta = 0.329$, $p = 0.000$) යන සියලුම විචල්‍යයන් ඉතා ඉහළ සංඛ්‍යාත්මක වැදගත්කමක් ($p<0.001$) සහ ධන සම්බන්ධතාවයක් පෙන්වයි. මේ දත්ත විශ්ලේෂණයෙන් පැහැදිලි වන්නේ අන්තර්ජාලයේ හෝ සමාජ මාධ්‍ය තුළ ඡායාරූප බෙදා ගැනීමට ඇති භීතිය, සබඳතාවලට ඇති අහිතකර බලපෑම් සහ රැකියාවට හෝ අධ්‍යාපනයට අහිතකර ලෙස බලපෑම වැඩිවන තරමට පුද්ගලයන්ට සමාජයට මුහුණ දීමට නොහැකි වීම ද සැලකිය යුතු ලෙස වර්ධනය වන බව යි.

Standardized Coefficients (Beta) අනුව 'අන්තර්ජාලයේ හෝ සමාජ මාධ්‍යයේ ඡායාරූප බෙදා ගැනීමට ඇති බිය' ($\beta = 0.475$) යන විචල්‍ය ප්‍රධානතම බලපෑම්කාරී විචල්‍ය (strongest predictor) ලෙස හඳුනා ගත හැකි අතර 'රැකියාවට හෝ අධ්‍යාපනයට අහිතකර ලෙස බලපෑම' ($\beta = 0.329$) සහ 'සබඳතාවලට අහිතකර බලපෑම' ($\beta = 0.265$) යන විචල්‍යයන් ඉන් පසුව බලපෑම්කාරී වී තිබේ.

### 3.3 විස්තරාත්මක දත්ත විශ්ලේෂණය (Descriptive Statistics)

#### 3.3.1 ටෙලිග්‍රෑම් නාලිකා තුළින් බෙදාහරින ලද ඡායාරූප/ වීඩියෝවල ස්වාභාවය

3.3.1 වගුව : ටෙලිග්‍රෑම් නාලිකා තුළ බෙදාහරින ලද ඡායාරූප හා වීඩියෝවල ස්වාභාවය

| බෙදාහරින ලද අන්තර්ගතයේ ස්වාභාවය | ප්‍රතිචාරය | |
|---|---|---|
| | ප්‍රමාණය | ප්‍රතිශතය % |
| සමාජ මාධ්‍යයේ පළ කළ ඡායරූපයක් | 26 | 21.1 |
| නිරුවත් ඡායාරූපයක් | 18 | 14.6 |
| අඩ නිරුවත් ඡායාරූපයක් | 13 | 10.6 |
| ලිංගිකව හැසිරෙන වීඩියෝවක් | 11 | 8.9 |
| සංස්කරණය කරන ලද ඡායාරූපයක් | 15 | 12.2 |
| කෘත්‍රිම බුද්ධියෙන් සකසන ලද ඡායාරූපයක් | 11 | 8.9 |
| තිර-පටිගත කළ පුද්ගලික වීඩියෝ ඇමතුමක් | 5 | 4.1 |
| කිව නොහැක | 24 | 19.5 |
| **සමස්ත එකතුව** | **123** | **100.0** |

මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2026

මෙම වගුව සඳහා ප්‍රතිචාර දැක්වූවන්ට බහු පිළිතුරු ලබා දීමට අවස්ථාව ලබා දී තිබේ. එබැවින් සමස්ත අගය (ප්‍රමාණය) නියැදියේ ප්‍රමාණය වඩා වැඩි වේ. ඒ අනුව ටෙලිග්‍රෑම් නාලිකා ආශ්‍රිත රූප පාදක ලිංගික අපයෝජනය සඳහා යොදා ගන්නා ලද අන්තර්ගතයේ ස්වාභාවය පිළිබඳව සිදු කරන ලද දත්ත විශ්ලේෂණය අනුව සමාජ මාධ්‍ය තුළ පළ කරන ලද ඡායාරූපයක් ටෙලිග්‍රෑම් නාලිකා තුළ හුවමාරු වූ බවට සමස්ත නියැදියෙන් 21.1% (n=26) පිළිතුරු ලබා දී තිබේ. ඊට අමතර ව 'නිරුවත් ඡායාරූප' (14.6%), 'සංස්කරණය කරන ලද ඡායාරූප' (12.2%) සහ 'අඩ නිරුවත් ඡායාරූප' (10.6%) වැනි අන්තර්ගත වර්ග ද සැලකිය යුතු ප්‍රමාණයකින් ටෙලිග්‍රෑම් නාලිකා තුළ හුවමාරු වී ඇති බව පෙනී යයි. තවද, 'ලිංගිකව හැසිරෙන වීඩියෝ' සහ 'කෘත්‍රිම බුද්ධියෙන් සකසන ලද ඡායාරූප' යන ශානර දෙකම 8.9% (n=11) ලැබී තිබේ. ඊට අමතර ව 'තිර-පටිගත කළ (Screen recording) පුද්ගලික වීඩියෝ ඇමතුම්' වැනි අන්තර්ගත හුවමාරු වූ බවට සමස්ත නියැදියෙන් 4.1% (n=5) පිළිතුරු ලබා දී තිබේ.

**3.3.2 අදාළ රූප පාදක අන්තර්ගතයන් ටෙලිග්‍රෑම් නාලිකා තුළට මුදාහරින ලද පාර්ශ්වය**

3.3.2 වගුව : රූප පාදක ලිංගික අපයෝජනය සිදු කළ පාර්ශ්වයන්ගේ ස්වභාවය

| ටෙලිග්‍රෑම් නාලිකා තුළට මුදාහරින ලද පාර්ශ්වය | ප්‍රතිචාරය | |
|---|---|---|
| | ප්‍රමාණය | ප්‍රතිශතය % |
| වත්මන් සමීප සහකරු | 9 | 8.7 |
| පෙර සමීප සහකරු | 26 | 25.0 |
| මිතුරෙක් | 2 | 1.9 |
| පවුලේ සාමාජිකයෙක් | 2 | 1.9 |
| පාසලේ/ විශ්වවිද්‍යාලයේ/ වැඩබිමේ අයෙක් | 4 | 3.8 |
| නොදන්නා පාර්ශ්වයක් | 19 | 18.3 |
| මාර්ගගත/ සමාජ මාධ්‍ය කණ්ඩායමක් | 10 | 9.6 |
| අදාළ මුදාහැරීම සිදු කළ පාර්ශ්වය කවුරුන්ද කියා නොදනී | 26 | 25.0 |
| පැවසිය නොහැක | 6 | 5.8 |
| **සමස්ත එකතුව** | **104** | **100.0** |

මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2026

මෙම වගුව සඳහා ප්‍රතිචාර දැක්වූවන්ට බහු පිළිතුරු ලබා දීමට අවස්ථාව ලබා දී තිබේ. එබැවින් සමස්ත අගය (ප්‍රමාණය) නියැදියේ ප්‍රමාණය වඩා වැඩි වේ. ටෙලිග්‍රෑම් නාලිකා ආශ්‍රිත රූප පාදක ලිංගික අපයෝජනය සිදු කරන ලද පාර්ශ්වයන් කවරේද යන්න පිළිබඳ සිදු කරන ලද දත්ත විශ්ලේෂණයට අනුව 'පෙර සමීප සහකරු' සහ 'අදාළ

මුදාහැරීම සිදු කළ පාර්ශ්වය කවුරුන්ද කියා නොදනී' යන පිළිතුරු දෙකම ප්‍රමුඛ වී ඇති අතර ඒ සඳහා සමස්ත නියැදියෙන් 25.0% බැගින් (n=26) පිළිතුරු ලබා දී තිබේ. ඊට අමතර ව 'නොදන්නා පාර්ශ්වයක්' එම ඡායාරූප මුදාහැරි බවට සමස්ත නියැදියෙන් 18.3% (n=19) පිළිතුරු ලබා දී ඇති අතර 'මාර්ගගත/සමාජ මාධ්‍ය කණ්ඩායමක්' අදාළ ඡායාරූප මුදාහැරි බවට 9.6% (n=10) පිළිතුරු ලබා දී තිබේ. අන්තර්ජාලය තුළ අනන්‍යතාව නොදන්නා පුද්ගලයන් හෝ කණ්ඩායම් ද මෙවැනි අපයෝජන සඳහා සම්බන්ධ වන බව මේ දත්ත තුළින් අනාවරණය වේ. ඊට අමතර ව 'වත්මන් සමීප සහකරු' විසින් අදාළ ඡායාරූප අන්තර්ජාලයට මුදාහැරි බවට සමස්ත නියැදියෙන් 8.7% (n=9) පිළිතුරු ලබා දී ඇති අතර ඒ තුළින් සමීප සම්බන්ධතා තුළ ඇති විශ්වාසයද අපයෝජනයට ලක්විය හැකි බව පැහැදිලි වේ.

තවද 'පාසලේ/විශ්වවිද්‍යාලයේ/ වැඩබිමේ අයෙක්' (3.8%), 'මිතුරෙක්' (1.9%) සහ 'පවුලේ සාමාජිකයෙක්' (1.9%) වැනි සමීප පාර්ශ්වයන් ද මෙවැනි සිදුවීම්වලට සම්බන්ධ බවට අනාවරණය වීම තුළ සමාජයේ ආසන්න සබඳතා පවා සුරක්ෂිත නොවන බව පෙන්නුම් කරයි. එමෙන් ම සමස්ත නියැදියෙන් 5.8% එනම් 6 දෙනකු 'පැවසිය නොහැක' යනුවෙන් පිළිතුරු ලබා දී ඇති අතර ඒ තුළින් මෙම කරුණේ සංවේදීභාවය සහ බිය හේතුවෙන් තොරතුරු හෙළි කිරීමට ඇති අකමැත්ත පෙන්නුම් කරයි.

### 3.3.3. ටෙලිග්‍රෑම් නාලිකා තුළින් සිදුවන රූප පාදක ලිංගික හිරිහැර සම්බන්ධයෙන් බාහිර පාර්ශ්ව දැනුවත් කිරීම

3.3.3 වගුව : අපයෝජනය පිළිබඳ බාහිර පාර්ශ්වයන් දැනුවත් කිරීමේ ප්‍රවණතාව

| බාහිර පාර්ශ්ව දැනුවත් කිරීම | ප්‍රමාණය | ප්‍රතිශතය % |
|---|---|---|
| ඔව් | 63 | 63.0 |
| නැත | 37 | 37.0 |
| **සමස්ත එකතුව** | **100** | **100.0** |

මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2026

ටෙලිග්‍රෑම් නාලිකා තුළින් සිදුවන ලිංගික හිංසනයන් සම්බන්ධයෙන් බාහිර පාර්ශ්වයන් දැනුවත් කළේද යන්න සම්බන්ධයෙන් සිදු කරන ලද දත්ත විශ්ලේෂණය අනුව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 63%ක් තමා ලක්වූ හිංසනය සම්බන්ධයෙන් බාහිර පාර්ශ්වය දැනුවත් කළ බවට (ඔව්) පිළිතුරු ලබා දී තිබේ. එසේ ම සමස්ත නියැදියෙන් 37%ක් එසේ බාහිර පාර්ශ්වයක් දැනුවත් නොකළ (නැත) බවට ද පිළිතුරු ලබා දී තිබේ. ඒ අනුව

රූප පාදක ලිංගික අපයෝජනය වැනි සංවේදී කරුණු සම්බන්ධයෙන් බහුතරයක් බාහිර පාර්ශ්වයන් දැනුවත් කළත් බිය, ලැජ්ජාව හෝ විශ්වාස නොමැතිකම වැනි සාධක නිසා එසේ දැනුවත් නොකර සිටින බව මේ අනුව පෙනී යයි.

### 3.3.4. ටෙලිග්‍රෑම් නාලිකා තුළින් සිදුවන රූප පාදක ලිංගික හිරිහැර සම්බන්ධයෙන් දැනුවත් කළ පාර්ශ්වයන්

3.3.4 වගුව : අපයෝජනය පිළිබඳ දැනුවත් කළ පාර්ශ්වයන්

| දැනුවත් කළ පාර්ශ්වයන් | ප්‍රතිචාරය | |
|---|---|---|
| | ප්‍රමාණය | ප්‍රතිශතය % |
| පවුලේ සාමාජිකයන් | 48 | 23.9 |
| මිතුරන් | 40 | 19.9 |
| සමීප සහකරු | 21 | 10.4 |
| ආගමික නායකයන් | 7 | 3.5 |
| පාසලේ/ විශ්වවිද්‍යාලයේ උපදේශකයන් | 18 | 9.0 |
| රැකියා ස්ථානයේ බලධාරීන් | 7 | 3.5 |
| නීතිඥයන් | 8 | 4.0 |
| පොලිසිය | 14 | 7.0 |
| රාජ්‍ය නොවන සංවිධාන | 8 | 4.0 |
| මනෝ විද්‍යා උපදේශකවරුන් | 16 | 8.0 |
| මාර්ගගත සහාය කණ්ඩායම් | 1 | 0.5 |
| කිසිදු සහයෝගයක් නොලැබුණි | 3 | 1.5 |
| කිව නොහැක | 10 | 5.0 |
| **සමස්ත එකතුව** | **201** | **100.0** |

මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2026

මෙම වගුව සඳහා ප්‍රතිචාර දැක්වූවන්ට බහු පිළිතුරු ලබා දීමට අවස්ථාව ලබා දී තිබේ. එබැවින් සමස්ත අගය (ප්‍රමාණය) නියැදියේ ප්‍රමාණය වඩා වැඩි වේ. ඒ අනුව ටෙලිග්‍රෑම් නාලිකා තුළින් සිදුවන රූප පාදක ලිංගික හිරිහැර සම්බන්ධයෙන් දැනුවත් කළ පාර්ශ්වයන් සම්බන්ධයෙන් සිදු කරන ලද දත්ත විශ්ලේෂණය අනුව වැඩිම ප්‍රතිශතයක් පිළිතුරු ලෙස ලබා දී ඇත්තේ 'පවුලේ සාමාජිකයන්' (23.9%) සහ 'මිතුරන්' (19.9%) යන අවිධිමත් සහාය ජාලයන්ට දැනුවත් කිරීම සිදු කළ බව යි. මේ තුළින් මෙවැනි සිදුවීම්වලට ලක් වූ කාන්තාවන් මුලින් ම විශ්වාසය තබන්නේ සමීප සමාජ සම්බන්ධතා මත බව අනාවරණය කරයි. එසේ ම 'සමීප සහකරු' (10.4%) සහ 'පාසලේ/ විශ්වවිද්‍යාලයේ උපදේශකයන්' (9.0%) යන කාණ්ඩ ද සැලකිය යුතු ප්‍රතිශතයක් නියෝජනය කරන අතර මේ තුළින් සමීප සම්බන්ධතා සහ ආයතනික පරිසරයන් තුළින්

ද සහාය සෙවීමක් සිදුවන බව පෙනනුම් කරයි. තවද 'මනෝ විද්‍යා උපදේශකවරුන්' (8.0%), 'පොලිසිය' (7.0%), 'නීතිඥයන්' (4.0%) සහ 'රාජ්‍ය නොවන සංවිධාන' (4.0%) වැනි වෘත්තීය සහ නීතිමය ආධාර මාර්ග වෙත යොමු වීම අඩු ප්‍රමාණයකින් දක්නට ලැබේ. තව ද 'ආගමික නායකයන්' සහ 'රැකියා ස්ථානයේ බලධාරීන්' යන පාර්ශ්ව ද්විත්වයම 3.5%ක් (n=7) ලෙස සමානව පවතින අතර 'මාර්ගගත සහාය කණ්ඩායම්' (0.5%) හි සහයෝගය ලබා ගන්නා බවට අඩු ප්‍රමාණයක් පිළිතුරු ලබා දී ඇත. මෙම දත්ත විශ්ලේෂණයේ දක්නට ලැබෙන ප්‍රබල ම කරුණ වන්නේ වින්දිතයන්ට 'කිසිදු සහයෝගයක් නොලැබුණි' (1.5%) සහ ලැබුනු සහයෝගය සම්බන්ධයෙන් 'කිව නොහැක' (5.0%) ලෙස ප්‍රතිචාර ලබා දී තිබීම යි. එය මෙම ගැටලුවේ සංවේදීභාවය සහ සහාය ලබා ගැනීමේ අභියෝගයන් පිළිබඳ ගැටලු මතු කරයි.

### 3.3.5. ටෙලිග්‍රෑම් නාලිකා තුළින් සිදුවන රූප පාදක ලිංගික හිරිහැර සම්බන්ධයෙන් බාහිර පාර්ශ්වයක් දැනුවත් නොකිරීමට හේතු

3.3.5 වගුව : අපයෝජනය පිළිබඳ බාහිර පාර්ශ්වයක් දැනුවත් නොකිරීමට හේතු

| අදාළ සිදුවීම් සම්බන්ධයෙන් බාහිර පාර්ශ්වය දැනුවත් නොකිරිමට හේතු | ප්‍රතිචාරය | |
|---|---|---|
| | ප්‍රමාණය | ප්‍රතිශතය % |
| සමාජ අපකීර්තියට හෝ ලැජ්ජාවට ඇති බිය | 42 | 20.4 |
| අපරාධකරු විසින් පළිගනු ඇති බවට වන බිය | 13 | 6.3 |
| බලධාරීන් කෙරෙහි විශ්වාසයක් නොමැතිකම | 32 | 15.5 |
| පවුලේ හෝ සබඳතාවලට බලපෑම් සිදුවිය හැකි බවට බිය | 28 | 13.6 |
| ස්වයං වරදකාරීත්වය | 20 | 9.7 |
| ප්‍රසිද්ධියේ එම කරුණ සාකච්ඡා කිරීමට ඇති බිය | 29 | 14.1 |
| අදාළ සිදුවීම් වාර්තා කළ යුතු පාර්ශ්ව සම්බන්ධ දැනුවත්භාවය අවම වීම | 8 | 3.9 |
| වාර්තා කිරීම තුළින් සහයෝගයක් නොලැබෙන බවට විශ්වාස කිරීම | 26 | 12.6 |
| වෙනත් | 8 | 3.9 |
| **සමස්ත එකතුව** | **206** | **100.0** |

මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2026

ටෙලිග්‍රෑම් නාලිකා තුළින් සිදුවන රූප පාදක ලිංගික හිරිහැර සම්බන්ධයෙන් බාහිර පාර්ශ්වයක් දැනුවත් නොකිරීමට බලපෑ හේතු සම්බන්ධයෙන් සිදු කරන ලද ඉහත දත්ත විශ්ලේෂණය අනුව ප්‍රධානම හේතුව ලෙස හඳුනාගත හැක්කේ 'සමාජ අපකීර්තියට හෝ ලැජ්ජාවට ඇති බිය' යි. ඒ සඳහා සමස්ත නියැදියෙන් 20.4% (n=42) පිළිතුරු ලබා දී

තිබේ. එමෙන් ම 'බලධාරීන් කෙරෙහි විශ්වාසයක් නොමැතිකම' (15.5%) සහ 'ප්‍රසිද්ධියේ එම කරුණ සාකච්ඡා කිරීමට ඇති බිය' (14.1%) යන කරුණු ද සැලකිය යුතු ප්‍රමාණයකින් බලපෑ ඇති බව අනාවරණය විය. මේ සඳහා ආයතනික සහ සමාජීය විශ්වාස පිළිබඳ විශ්වාසයක් නොමැතිකම හේතුවක් විය හැකි ය. තවද 'පවුලේ හෝ සබඳතාවලට බලපෑම් සිදුවිය හැකි බවට බිය' (13.6%) සහ 'වාර්තා කිරීම තුළින් සහයෝගයක් නොලැබෙන බවට විශ්වාස කිරීම' (12.6%) යන සාධක ද ප්‍රධාන බාධක ලෙස පවතියි. ඊට අමතර ව 'ස්වයං වරදකාරීත්වය' (9.7%) සහ 'අපරාධකරු විසින් පළිගනු ඇති බවට වන බිය' (6.3%) යන කරුණු ද යම් තරමකින් හෝ බලපාන විට 'අදාළ සිදුවීම් වාර්තා කළ යුතු පාර්ශ්ව සම්බන්ධ දැනුවත්භාවය අවම වීම' (3.9%) හේතුව ද මේ සඳහා බලපා ඇති බව පෙනී යයි. ඒ තුළින් මෙවැනි සිදුවීම්වල වින්දිතයන් වන පාර්ශ්වයන්ට සහාය වීමට ඇති සමාජ ආරක්ෂණ ක්‍රමවේදවල දැනුවත්භාවය අවම වීම දැක්විය හැකිය.

## 4.0 සාකච්ඡා සහ සොයාගැනීම් (Discussion and Findings)

ශ්‍රී ලංකාවේ ටෙලිග්‍රෑම් නාලිකා ආශ්‍රිතව රූප පාදක (ඡායාරූප සහ වීඩියෝ) ලිංගික අපයෝජන හේතුවෙන් කාන්තාවන්ට සිදුවන බලපෑම පිළිබඳ සිදු කරන ලද මෙම අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය වන සොයාගැනීම් තවදුරටත් සාකච්ඡා කිරීම මෙම කොටසේ දී සිදු වේ. ටෙලිග්‍රෑම් නාලිකාවල ආරම්භය 2013 වසරේ සිදු වුවත් ශ්‍රී ලංකාව තුළ එය වඩාත් ජනප්‍රිය වීම ආරම්භ වූයේ 2020 වසරේ සිට ය. එනම්, කොරෝනා වෛරසය ලොව ව්‍යාප්ත වූ සමයේ සිට ය. මෙම ටෙලිග්‍රෑම් නාලිකා මෙරට ව්‍යාප්තියේ උච්චස්ථානය 2021 සහ 2023 යන වසර අතර කාලය තුළ සිදු වූ අතර ඒ සඳහා බලපෑ මූලික හේතුව ලෙස ලොව පුරා කොවිඩ් 19 වෛරසය ව්‍යාප්ත වීමත් සංචරණ සීමා පැනවීම සහ හුදකලා කිරීම යන හේතු දැක්විය හැකි ය. 2020 වසරේ සිට 2022 වසර දක්වා වූ කාලයේ කොවිඩ් 19 වසංගතයට මුහුණ දීමට ශ්‍රී ලංකාවට ද සිදු විය. හුදෙකලාකරණය (Lockdown), නිවසේ සිට මාර්ගගත ක්‍රමයට රාජකාරී කිරීමට සිදු වීම (Work from home), මාර්ගගත වේදිකාවල (Online platform) වර්ධනය සමඟ මිනිසුන් පෙර නොවූ විරූ ආකාරයට ඩිජිටල් තාක්ෂණය හා ඒකාබද්ධ විය. එම කාලයේ සමස්ත සමාජය ම ඩිජිටල් පරිවර්තනයක් කරා යොමු වූ අතර එහි අතුරු ප්‍රතිඵලයක් ලෙස මෙවැනි අසභ්‍ය අන්තර්ගතයන් ඇතුළත් ටෙලිග්‍රෑම් නාලිකා රැසක් ද බිහි විය. මේ නාලිකා මඟින් කාන්තාවන්ගේ නිරුවත්, අඩ-නිරුවත් ඡායාරූප සහ වීඩියෝ බෙදාහැරීම ද ප්‍රබල ලෙස සිදු විය. ඒ සඳහා බලපෑ හේතු කිහිපයක් හඳුනාගත හැකිය. එනම්,

01- නීතිමය වශයෙන් තහනම් මාධ්‍ය පයීතයන් (අසභ්‍ය අන්තර්ගත සහිත වීඩියෝ/ ඡායාරූප) අනන්‍යතාව සඟවා පාඨකයා වෙත ගෙන යා හැකි පහසු ම විකල්ප මාධ්‍ය වූයේ ටෙලිග්‍රෑම් මාධ්‍ය වීම.

එයට හේතුව එහි ඇති පුද්ගල අනන්‍යතාව සඟවා තැබීමේ හැකියාව යි. වාරණය (Censorship) අවම සමාජ මාධ්‍ය ජාලාවක් නිසා ප්‍රධාන ධාරාවේ මාධ්‍යයන්ට සාපේක්ෂ ව විකල්ප මාධ්‍යයක් ලෙස ක්‍රියාත්මක වීමට හැකියාව පවතී.

02- තාක්ෂණික වශයෙන් පහසු මාධ්‍යයක් වීම.

එනම්, සීමාවක් නොමැති ව පරිශීලකයන් ඇතුළත් කර ගත හැකි වීම සහ ඕනෑ ම ක්‍රමවේදයක් උපයෝගී කර ගෙන අන්තර්ගතය පරිශීලකයන් වෙත ගෙන යාමට හැකි වීම මෙහි දී වැදගත් සාධකයක් විය.

03- වානිජවාදී අරමුණු මුදුන්පත් වීම.

එනම්, වෙබ් අඩවියක් ක්‍රියාත්මක කිරීමට ඩොමේන් පහසුකම මිලදී ගැනීමත් වැඩි ධාරිතාවයකින් යුත් පරිගණක පද්ධතියක් අවශ්‍ය වුවත් ටෙලිග්‍රෑම් නාලිකාවක් ක්‍රියාත්මක කිරීමට සාමාන්‍ය සුහුරු ජංගම දුරකථනයකට හැකියාව පවතී. ඊට අමතර ව වැඩි පරිශීලකයන් ප්‍රමාණයක් එකතු කර ගැනීම තුළ දැන්වීම් පළ කිරීමට මෙන් ම මුදල් ගෙවා අදාළ අන්තර්ගත පරිශීලනයට පහසුකම ලබා දීමේ හැකියාව ද පවතී.

04- ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික බංකොලොත්භාවය සහ කොවිඩ් 19 වෛරසයේ බලපෑම නිසා ඇති වූ හුදෙකලාකරණය.

කොවිඩ් වෛරසය ව්‍යාප්ත වූ සමයේ සංචරණ සීමා ක්‍රියාත්මක වීමත් නිවසේ සිට වැඩ කිරීමට සිදුවීමත් නිසා බොහෝ සබඳතා දුරස් වූ අතර ඒ නිසා ඇති වූ මානසික ආතතිය දුරුකර ගැනීම සඳහා මෙකී පයීතයන් වෙත ප්‍රවේශ වීම සිදු විය.

05- නව යෞවනයන් ඩිජිටල් සංස්කෘතිය වෙත ප්‍රවේශය වැඩි වීම.

එනම්, ඩිජිටල් යුගයේ දී යෞවනයන්ගේ මාධ්‍ය භාවිතය නව ආකාරයකින් පරිවර්තනය වී ඇති අතර ටෙලිග්‍රෑම් වැනි වේදිකා ඔවුන්ගේ දෛනික සන්නිවේදන හා අන්තර්ගත භාවිතයේ මධ්‍යස්ථානයක් බවට පත්විය. විශේෂයෙන් යෞවනයන් තුළ පවතින ලිංගික

කුතුහලය (Sexual curiosity), සමවයස් පීඩනය (Peer influence) සහ ඩිජිටල් පරික්ෂාකාරීත්වය (Digital experimentation) යන සාධක ඔවුන් අසභ්‍ය කතා වැනි අන්තර්ගත නිර්මාණය හා පරිභෝජනය වෙත යොමු වීමට හේතු වේ. මෙය සමාජ විද්‍යාත්මකව 'Youth subculture' යන සංකල්පය යටතේ විග්‍රහ කළ හැකි ය. යෞවනයන් තමන්ගේ ම 'සංස්කෘතික හැඳුනුම්කරණයක්' (Cultural identity) නිර්මාණය කර ගැනීම සඳහා ප්‍රධාන සමාජයෙන් වෙනස් වූ උප සංස්කෘතිකරණය වූ අන්තර්ගත හා ක්‍රියාකාරකම් තෝරා ගන්නා බව පෙන්වයි. මෙය තාක්ෂණික ප්‍රවණතාවකට වඩා ශ්‍රී ලංකාවේ සමාජ-සංස්කෘතික සහ දේශපාලන පරිසරය සමඟ සම්බන්ධ වූ බහු-පාරිභෝගික (Multi-dimensional) සංසිද්ධියක් ලෙස සැලකිය යුතුය.

ශ්‍රී ලංකාවේ රූප පාදක ලිංගික අපයෝජනය (Image-Based Sexual Abuse–IBSA) යනු පුද්ගල මට්ටමේ සිදුවන තනි සිදුවීමක් ලෙස නොව සමාජීය වශයෙන් ව්‍යුහගත වූ බහුමානික හා සංකීර්ණ ගැටලුවක් ලෙස අවබෝධ කරගත යුතුය. විශේෂයෙන්, මෙම ගැටලුව මානසික, සමාජීය සහ ආර්ථික පද්ධති තුළ අන්තර්සම්බන්ධිත බලපෑම් ඇති කරන බව මෙම පර්යේෂණයේ ප්‍රතිඵල මඟින් තහවුරු වේ.

**වින්දිතයන්ගේ ව්‍යාප්තිය**

රූප පාදක ලිංගික අපයෝජනය සම්බන්ධයෙන් සිදු කරන ලද මෙම පර්යේෂණයේ දී එකී සිදුවීම්වල වින්දිතයන් වූ පාර්ශ්වයන්ගේ ජනවිකාශ සාධක සම්බන්ධයෙන් සිදු කරන ලද දත්ත විශ්ලේෂණයේ දී අදාළ සිදුවීම්වලට මුහුණ දුන් වින්දිතයන්ගේ ව්‍යාප්තිය මෙසේ ගෙන හැර දැක්විය හැකිය. මෙවැනි හිංසනයන්ට ලක්වන බහුතරයක් Z සහ Y යන පරම්පරාවන්ට අයත් වන අතර ඩිජිටල් තාක්ෂණය සමඟ සමීප සම්බන්ධතාවක් මොවුන්ට පැවතීම ඊට හේතුව යි. එසේ ම මෙවැනි සිදුවීම් වැඩි වශයෙන් වාර්තා වන්නේ නාගරික සහ ඩිජිටල් ප්‍රවේශය වැඩි ප්‍රදේශ එනම්, කොළඹ, ගම්පහ, මහනුවර, ගාල්ල, මාතර වැනි දිස්ත්‍රික්කවල ය. අන්තර්ජාල ප්‍රවේශය වැඩි වීම, ඩිජිටල් සන්නිවේදන ක්‍රියාකාරකම් බහුල වීම මීට හේතුව යි. ග්‍රාමීය ප්‍රදේශවල මෙවැනි සිදුවීම් වාර්තා වීම අවම වී ඇත්තේ ඩිජිටල් ක්‍රියාකාරකම් අඩුවීම මෙන් ම සමාජ හා සංස්කෘතික හේතු සාධක නිසා අදාළ සිදුවීම් වාර්තා වීම අවම වීම යි.

**මානසික බලපෑම**

රූප පාදක ලිංගික අපයෝජනය නිසා සිදුවන මානසික බලපෑම් සම්බන්ධයෙන් සලකා බැලූ විට ප්‍රතිචාරකයන් අතර බිය, චිත්තවේගීය ආතතිය, නින්ද නොමැති වීම සහ සමාජ භීතිය වැනි ලක්ෂණ ඉස්මතු වී තිබේ. රූප පාදක ලිංගික අපයෝජනය විසින් පුද්ගලයාගේ මානසික ස්ථායීභාවය හා ස්වයං-අගය (Self-esteem) ඍජුව ම බිඳ දැමීමට හැකි බවට තර්කානුකූලව සනාථ වී ඇත. ප්‍රතිගාමී (Regression) විශ්ලේෂණය තුළින් 'අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය තුළ ඡායාරූප බෙදාගැනීමට ඇති භීතිය' ප්‍රධානතම බලපෑම්කාරී විචල්‍ය (β=0.475) ලෙස හඳුනා ගැනීම තුළින් මෙම මානසික ප්‍රතිචාරයන් නිරායාසව නොව විශේෂිත ඩිජිටල් අත්දැකීම්වලට ඍජුව සම්බන්ධ බව තහවුරු කරයි. එමඟින් රූප පාදක ලිංගික අපයෝජන සිදුවීමෙන් පසු 'ද්විතීයික ගොදුරු බවට පත්වීම' (Secondary victimization) ලෙස හැඳින්විය හැකි දිගුකාලීන මානසික පීඩනයක් නිර්මාණය වේ. එනම්, එකී ඡායාරූප සහ වීඩියෝ වෙනත් පාර්ශ්වයක් අතට පත්වීමෙන් පසු තර්ජනය කරමින් මුදල් හෝ වෙනත් වාසි ලබා ගැනීමට පෙළඹිය හැකි නිසා ය. එම නිසා නිරන්තරයෙන් බියෙන්, සැකයෙන් සිටීමට සිදුවන අතර මේ නිසා දැඩි මානසික පීඩනයකට පවා නතු වේ.

**සමාජීය බලපෑම්**

සමාජීය බලපෑම් සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට සබඳතා බිඳවැටීම, සමාජයෙන් වෙන්වීම හා සමාජ අපහාසය වැනි ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදු වේ. ශ්‍රී ලංකාවේ සමාජ ව්‍යුහය තුළ 'ලිංගික සදාචාරය' (Sexual morality) හා 'ලැජ්ජා සංස්කෘතිය' (Culture of shame) තවමත් බලවත් ලෙස ක්‍රියාත්මක වීම ඊට හේතුවයි. විශේෂයෙන් 'පෙර සමීප සහකරු' විසින් රූප පාදක ලිංගික අපයෝජන සිදු කිරීමේ ඉහළ ප්‍රතිශතය (25%) සලකා බැලූ විට මෙම ගැටලුව බහුලව පෞද්ගලික සම්බන්ධතා තුළ ඇති බල-සම්බන්ධතා (Power relations) හා විශ්වාසය කඩවීම මත පදනම් වන බව විග්‍රහ කළ හැකිය. එමෙන් ම නොදන්නා පාර්ශ්වයන් සහ මාර්ගගත කණ්ඩායම්වල භූමිකාව මඟින් රූප පාදක ලිංගික අපයෝජන යනු සම්ප්‍රදායික සම්බන්ධතා සීමා ඉක්මවා සයිබර් පරිසරයේ ''ජාලගත අපයෝජන' (Networked abuse) ආකාරයක් ලෙස ව්‍යාප්ත වන බව තහවුරු වේ.

### ආර්ථික බලපෑම

රූප පාදක ලිංගික අපයෝජනයේ ආර්ථික බලපෑම් පිළිබඳව විග්‍රහ කිරීමේ දී රැකියාව හා අධ්‍යාපනයට සිදුවන අහිතකර බලපෑම් ද්විතීයික නමුත් වැදගත් ප්‍රතිවිපාක ලෙස හඳුනාගත හැකි ය. ප්‍රතිගාමී (Regression) විශ්ලේෂණයේ ප්‍රතිඵල අනුව 'රැකියාවට/අධ්‍යාපනයට ඇති බලපෑම' (β=0.329) සංඛ්‍යාත්මකව වැදගත් වීම මෙම ගැටලුව පුද්ගලයාගේ ජීවන අවස්ථා (Life chances) හා සමාජ-ආර්ථික ගමනාගමනය (Social mobility) ඍජුව ම සීමා කරන බව පෙන්වයි. ඒ අනුව රූප පාදක ලිංගික අපයෝජන යනු තනි සිද්ධියක් නොව කාන්තාවන්ගේ දිගුකාලීන ආර්ථික ස්ථායීභාවයට බලපාන ව්‍යුහගත ගැටලුවක් ලෙසද අර්ථකථනය කළ හැකි ය.

### තාක්ෂණික අපයෝජනය

රූප පාදක ලිංගික අපයෝජන සිදුවීම්වල දී ටෙලිග්‍රෑම් නාලිකාවල බෙදාහැරෙන අන්තර්ගතයේ ස්වභාවය පිළිබඳ සලකා බැලීමේ දී සමාජ මාධ්‍ය ඡායාරූප පවා අපයෝජනයට ලක්වන බව පර්යේෂණය තුළින් අනාවරණය විය. මෙය 'කැමැත්ත' (Consent) යන සංකල්පය සම්පූර්ණයෙන් ම නොසලකා හැරෙන 'සයිබර් සංස්කෘතියක්' (Cyber culture) පවතින බව පෙන්වීමකි. තාක්ෂණික වශයෙන් සංස්කරණය කරන ලද හෝ කෘත්‍රිම බුද්ධියෙන් නිර්මාණය කරන ලද (AI generated) අන්තර්ගත ද භාවිත වීම රූප පාදක ලිංගික අපයෝජනය නව තාක්ෂණික අවධියකට (Technologically mediated abuse) පත්වී ඇති බව පෙන්නුම් කරයි.

### යුක්තිය ඉටු කර ගැනීමට ඇති බාධා

රූප පාදක ලිංගික අපයෝජන සම්බන්ධයෙන් බාහිර පාර්ශ්වයන්ට දැනුම් දීමේ රටාව සම්බන්ධයෙන් පර්යේෂණය තුළින් සිදු කරන ලද සොයා ගැනීම්වලට අනුව බහුතරය (63%) බාහිර පාර්ශ්වයන් දැනුවත් කර තිබුණ ද සැලකිය යුතු කොටසක් එසේ නොකිරීම සමාජ-සංස්කෘතික හා ආයතනික බාධකවල ප්‍රතිඵලයක් ලෙස විග්‍රහ කළ හැක. විශේෂයෙන් සමාජ අපකීර්තියට ඇති බිය, බලධාරීන් කෙරෙහි විශ්වාස අවම වීම සහ පවුල් සබඳතා බිඳවැටීමේ බිය වැනි සාධක මෙවැනි සිදුවීම් වාර්තා නොකිරීමට (Reporting gap) හේතු බව පැහැදිලි වේ. මෙය 'වින්දිතයා වැරදිකරු වීමේ' (Victim-blaming) සංස්කෘතිය සහ ආයතනික දුර්වලතා අතර සම්බන්ධතාවය තවදුරටත් තහවුරු කිරීමකි.

දැනුවත් කළ පාර්ශ්වයන් සම්බන්ධයෙන් සිදු කරන ලද දත්ත විශ්ලේෂණයේ දී පවුල හා මිතුරන් වැනි අවිධිමත් ජාලයන් වෙත වැඩි වශයෙන් යොමු වීමත් විධිමත් නීතිමය හා වෘත්තීය සහාය පද්ධති පිළිබඳ විශ්වාසය අවම බවත් අනාවරණය විය. පොලිසිය, නීතිඥයන් හෝ රාජ්‍ය නොවන සංවිධාන වෙත යොමු වීම අඩු වීම, ප්‍රවේශ බාධා, දැනුවත්භාව අවම වීම සහ ආයතනික ප්‍රතිචාර කාර්යක්ෂම නොවීම යන කරුණු මේ සඳහා බලපා තිබේ.

සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ ටෙලිග්‍රෑම් නාලිකා ආශ්‍රිතව රූප පාදක (ඡායාරූප සහ වීඩියෝ) ලිංගික අපයෝජන සිදුවීම් කාන්තාවන්ගේ මානසික, සමාජීය සහ ආර්ථික තත්ත්වයට සෘණාත්මක බලපෑමක් ඇති කරන බව මෙම පර්යේෂණය තුළින් සනාථ විය. මෙම අධ්‍යයනයේ සොයාගැනීම් අනුව ටෙලිග්‍රෑම් නාලිකා ආශ්‍රිත රූප පාදක ලිංගික අපයෝජනය ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට බලපාන සමාජීය අසාධාරණත්වයක් (Social injustice) ලෙස හඳුනාගත හැකි අතර එය පුද්ගලික අත්දැකීමක් පමණක් නොව, සමාජ ව්‍යුහ, ලිංගික බල සම්බන්ධතා සහ ඩිජිටල් තාක්ෂණික පද්ධති අතර අන්තර්ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙසද විග්‍රහ කළ හැකිය. එබැවින් මෙම ගැටලුවට ප්‍රතිචාර දක්වීම සඳහා නීතිමය ප්‍රතිසංස්කරණ සිදු කිරීම, ඩිජිටල් වේදිකා තුළ වගවීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සහ මෙවැනි හිංසනයන්ට ගොදුරු වූවන් සඳහා වූ සහන පද්ධති ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය බව මෙම පර්යේෂණය තුළින් යෝජනා කරනු ලබයි.

**4.1 අධ්‍යයනයේ සීමා**

මෙම අධ්‍යයනය සිදු කිරීමේ මුඛ්‍ය වශයෙන් සීමා කිහිපයක් හඳුනාගත හැකිය. පළමුව නියැදිය තෝරා ගැනීම සඳහා හිමබෝල නියැදි ක්‍රමය භාවිත කළ බැවින් ප්‍රතිඵල ශ්‍රී ලංකාවේ සියලු ම රූප පාදක ලිංගික අපයෝජනයට ලක් වූ කාන්තාවන් වෙත සාමාන්‍යකරණය කිරීමේ සීමාවක් පවතී. දෙවනුව දත්ත ස්වයං වාර්තාකරණ (self-reported) ප්‍රශ්නාවලියක් මත පදනම් වූ බැවින් මතක දෝෂ (recall bias) හෝ සමාජීය වශයෙන් පිළිගත හැකි පිළිතුරු ලබාදීමේ ප්‍රවණතාව (social desirability bias) ඇති විය. තෙවනුව මෙම අධ්‍යයනය කාන්තාවන්ට පමණක් සීමා වූ බැවින් පුරුෂයන් හෝ වෙනත් ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයන් මුහුණ දෙන අත්දැකීම් විමර්ශනය නොකිරීම සිදු විය. එමෙන්ම Telegram වේදිකාව මත පමණක් කේන්ද්‍ර කරගත් බැවින් Facebook, WhatsApp, Instagram සහ TikTok වැනි වෙනත් සමාජ මාධ්‍ය වේදිකාවල පවතින තත්ත්වය මෙහි අන්තර්ගත නොවේ. එබැවින් මේ සීමාවන් සම්බන්ධයෙන් අවධානය යොමු කර ඉදිරි පර්යේෂණ සඳහා විෂය සකස් කර ගැනීම සිදු කළ හැකිය.

**5.0 නිගමන**

ශ්‍රී ලංකාවේ ටෙලිග්‍රෑම් නාලිකා ආශ්‍රිත රූප පාදක ලිංගික අපයෝජනය කාන්තාවන්ට මානසික, සමාජීය සහ ආර්ථික වශයෙන් බරපතළ හානියක් සිදු කරන ඩිජිටල් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයක් බව මෙම අධ්‍යයනය මඟින් තහවුරු වේ. ස්ත්‍රීවාදී න්‍යාය සහ සයිබර් ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ රාමුවට (Cyber Gender-Based Violence Framework) අනුව විග්‍රහ කරන විට මෙම අපයෝජනය තාක්ෂණය භාවිතයෙන් ප්‍රතිනිර්මාණය වන පුරුෂාධිපත්‍ය බල සම්බන්ධතා සහ සමාජීය පාලන යාන්ත්‍රණවල ප්‍රකාශනයක් ලෙස සැලකිය හැකිය. එනම් ඩිජිටල් අවකාශය තුළ කාන්තාවන්ගේ ශරීරය, පෞද්ගලිකත්වය සහ ලිංගික අනන්‍යතාව පාලනය කිරීමේ නව මාධ්‍යමය ආකාරයක් ලෙස IBSA ක්‍රියාත්මක වන බවයි. එබැවින් මෙම ගැටලුව තනි පුද්ගල චර්යාවක ප්‍රතිඵලයක් ලෙස නොව සමාජ ව්‍යුහයන්, සංස්කෘතික සම්මතයන් සහ ඩිජිටල් තාක්ෂණයන් අතර පවතින අන්තර්සම්බන්ධිත ක්‍රියාවලියක් ලෙස වටහා ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ වින්දිත කේන්ද්‍රය නීතිමය ප්‍රතිසංස්කරණ, ඩිජිටල් වේදිකා වගවීම සහ සමාජ දැනුවත්භාවය ඉහළ නැංවීම මඟින් පමණක් මෙම ගැටලුවට දිගුකාලීන හා තිරසාර විසඳුම් ලබා දිය හැකි බව මෙම අධ්‍යයනය නිගමනය කරයි.

**මූලාශ්‍ර**


Biswas, A. (2023). *The great gender glitch: Women and online violence*. Observer Research Foundation. https://www.orfonline.org/expert-speak/the-great-gender-glitch/

Chawki, M. (2021). Online child pornography: A new challenge for the society. In *ConScienS Conference Proceedings* (pp. 2021–2021).

DataReportal. (2025). *Digital 2025: Sri Lanka*. https://datareportal.com/reports/digital-2025-sri-lanka?utm_source=chatgpt.com

Department of Census and Statistics Sri Lanka. (2023). *Computer literacy statistics*.

Franco, M., Gaggi, O., & Palazzi, C. E. (2024). Characterizing non-consensual intimate image abuse on Telegram groups and channels. In *Proceedings of OASIS '24*. ACM. https://doi.org/10.1145/3677117.3685008

Harasgama, K. S., Karunasena, K., Senarath, S., Jayamaha, S., Mahingoda, C. B., &

Deshapriya, W. (2025). Prevalence, nature and impacts of non-sexual online harassment in Sri Lanka: A quantitative analysis. *Social Sciences & Humanities Open, 12*, 101953. https://doi.org/10.1016/j.ssaho.2025.101953

Hinduja, S., & Patchin, J. W. (2008). Cyberbullying: An exploratory analysis of factors related to offending and victimization. *Deviant Behavior, 29*, 129–156.

Hinson, L., Mueller, J., O'Brien-Milne, L., & Wandera, N. (2018). *Technology-facilitated gender-based violence: What is it, and how do we measure it?* International Centre for Research on Women.

Palansuriya, N., & Perera, M. (2023). *Beyond the screen: Perceptions of lawyers on response mechanisms for cyber sexual and gender-based violence in Sri Lanka*. Search for Common Ground Sri Lanka.

Perera, P., Balamayuran, M., Alahendra, T., & Bandara, S. (2021). *Online survey on youth, social media, and violence in Sri Lanka*. British Council & Sarvodaya Institute for Higher Learning.

Pew Research Center. (2021). *The state of online harassment*. https://www.pewresearch.org/internet/2021/01/13/the-state-of-online-harassment/

Samarakoon, S., Cooray, J., de Silva, M., Siriwardhana, K., & Silva, N. (2021). *Context assessment of gendered online hate speech and cyber sexual and gender-based violence in Sri Lanka*. Search for Common Ground Sri Lanka.

Sidoti, C., Beckman, E. M., Monte, N., & Rizzato, G. (2023). *IBSA 2023 report: Image-based sexual abuse within Telegram groups*. PermessoNegato APS.

Sri Lanka Computer Emergency Readiness Team (SLCERT). (2020). *Annual report 2020*.

Sri Lanka Computer Emergency Readiness Team (SLCERT). (2021). *Annual report 2021*.

Telecommunications Regulatory Commission of Sri Lanka (TRC). (2025). *Telecommunication statistics report – Q4 2025*.

United Nations Human Rights Council. (2018). *Report of the Special Rapporteur on violence against women, its causes and consequences on online violence against women and girls from a human rights perspective (A/HRC/38/47)*. https://digitallibrary.un.org/record/1641160

Vishnuprasad, P., & Mathew, M. (2020). Social media websites and circulation of explicit contents: With special reference to Kerala, India. *International Journal of Indian Psychology, 8*(3), 1376–1384. https://doi.org/10.25215/0803.161